# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ ඉල් අමාවක පෝදු 2022 නොවැම්බර් 23 බදාදා BUDUSARANA WEDNESDAY NOVEMBER 23, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 23 පත්‍රය, පිටු 11 ආරම්භය 1965 - 06 - 13



යහලමුල්ල අතුරලිය විහාරයේ බුද්ධ ප්‍රතිමා වහන්සේ

ඡායාරූපය - නිශ්ශංක විජේරත්න

# උගත්කම බබළන්නේ ගුණදහම් වැඩි තරමටයි

**පුද්ගලයකුගේ දියුණුව ක්‍රම දෙකකින් මනින්නට පුළුවන්. ඒ තමයි ආධ්‍යාත්මික දියුණුව හා බාහිර දියුණුව. බාහිර දියුණුව කියන්නේ ධන ධාන්‍ය වතුපිටි උපයා සපයාගෙන, හරි හම්බ කරගෙන, යාන වාහන අරගෙනන, සුඛෝපභෝගී ලෙස ජීවත් වීමයි.**

ඒත් ආධ්‍යාත්මික දියුණුව මීට වඩා වෙනස්. මනුෂ්‍යයකු තුළ ගුණ ධර්ම වැඩිවෙන තරමට ඔහු තුළ ආධ්‍යාත්මික දියුණුවත් පවතිනවා. මේ දෙයාකාර දියුණුව කෙනෙක් තුළ ඇත්නම් අපට පුළුවන් ඔහු නියම සාර්ථක ජීවිතයක් ගත කරනවා කියන්න. ආධ්‍යාත්මික දියුණුවේ උපරිම අවස්ථාව විමුක්තිය අවබෝධ කර ගැනීමයි. ඉතින් අද අප බුදුරජාණන් වහන්සේ දේශනා කළ මෙලොව මෙන් ම පරලොව ජීවිතයත් දියුණු කර ගන්න පුළුවන් කරුණු ගැන කතා කරමු.

පින්වතුනි,බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කළ කාලේ එක්තරා බමුණෙක් හිටියා අත්තස් සද්වාර කියලා. ඒ බමුණාට හිටියා එක පුතෙක්. එක දවසක් මේ බමුණු පුතා තම පියාගෙන් ඇහුවා “තාත්තේ, මට දියුණුවන්න ඕනෑ. ඒකට උපදෙස් දෙන්න” කියලා.

මේ වැනි ප්‍රශ්නයක් ඉතා ම කලාතුරකින් විශේෂයෙන් පුතෙක් තාත්තා කෙනෙක්ගෙන් අහන්නේ. ඒ නිසා බමුණා කල්පනා කළා මගේ පුතා අසන ප්‍රශ්නය ඉතා ම වටිනවා. එනිසා මෙයට පිළිතුරු දීමට මට වඩා සුදුසු උත්තමයෙක් සිටිනවා කියලා පුතත් සමඟ බුදුරජාණන් වහන්සේ ළඟට ගිහින් “ස්වාමීනි, මගේ පුතා දියුණුවීමට කරුණු අහනවා. අපට අනුකම්පා කර කියා දෙන්න” කියා ගෞරවයෙන් ආරාධනා කර සිටියා. ඊට පස්සේ අපේ බුදුරජාණන් වහන්සේ දියුණුවීමට අවශ්‍ය කරුණු 6ක් දේශනා කළා.



නිරෝගිකම උතුම් ලාභයයි. සිල්වත් බව, වැඩිහිටියන් ගේ අවවාද පිළිගැනීම, උගත්කම, දැහැමි බව, අනලස් බව, මේ කරුණු කෙනකු තුළ ඇත්නම් ඒ ජීවිතය දියුණු වන බව ප්‍රකාශ කරන්න පුළුවන්.’

කොපමණ සම්පත් තිබුණත් නිරෝගිකම නැත්නම් ඒ ජීවිතය සැපවත්, සැනසිලිදායක හැටියට සලකන්න කොහොමටවත් බැහැ. ඒවගේම කිසිම ධනයක්, වස්තුවක් නැති දුප්පත් කෙනකු ළඟ වුණත් නිරෝගිකම තියෙනවා නම් එය සතුටට කාරණාවක්.

මනුෂ්‍යයකුට ලෙඩ හැදෙන ක්‍රම දෙකක් තියෙනවා. ඒ තමයි සිත ලෙඩ වීම හා කය ලෙඩවීම කියන්නේ. මේ දෙවිදියට ම හැදෙන ලෙඩ අප සුව කර ගන්න ඕනෑ.

සිතේ ඇතිවන ලෙඩ තමයි රාගය, ද්වේෂය, මෝහය, ඊර්ෂ්‍යාව, පළිගැනීම, අහංකාරකම කියන්නේ. මෙවැනි ලෙඩ තියාගෙන දියුණුවෙන්න අමාරුයි. ඒ වගේම තමයි මෙවැනි දේ තුළින් සිත ලෙඩ වුවහොත් අපට දේශීය විදේශීය, බෙහෙත් පාවිච්චි කරලා සුව කරගන්න බැහැ. අපේ බුදුහාමුදුරුවෝ දේශනා කළා සිත යහපත්ව තියා ගන්න අයුරු. ඒ අනුව දහම් පොත් බලනවා නම්, දහම් අසනවා නම්, පුළුවන් විදිහට භාවනා කරනවා නම් අපට පුළුවනි සිත ද්වේෂය ආදියෙන් ලෙඩ නොවී තියාගන්න.

ඒ නිසා අප කය ලෙඩ වීමෙනුත් මේ විදිහට සිත ලෙඩ වීමෙනුත් වැළැකිලා නිරෝගීමත් වෙමු. එසේ වුණොත් මෙලොව පරලොව ජය ගන්න හැකියාව ලැබෙනවා.

දියුණුවට හේතුවන දෙවැනි කාරණය “සීලං ච” සිල්වත් බවයි. මෙය හැම ජීවිතයකට ම දියුණුවීමට අත්‍යවශ්‍ය දෙයක්. “සුඛං යාව ජරා සීලං” ජරාව හෙවත් ජීවිතාවසානය දක්වා සිල් රැකීම සැපයට හේතුවනවා. සීලයේ ප්‍රභේද ගණනාවක් තියෙනවා. පඤ්ච සීලය, ආජීව අෂ්ටමක සීලය, උපෝසථ අෂ්ඨාංග සීලය, නවාංග සීලය, දස සීලය, සාමණේර සීලය හා උපසපන් සීලය යනාදී විදිහට. ඉතිං අපට මේ සිල්වලින් තමන්ට පහසු සීලයක් සමාදන් වී ආරක්ෂා කිරීමට පුළුවන්. ඒ විශේෂයෙන් ගිහි පින්වතුන් නිත්‍ය පඤ්ච සීලය දිවි හිමියෙන් සුරැකිය යුතුය.

සීලය කියන්නේ සිත, කය, වචනය කියන මේ දොරටු තුනේ ඇති සංවර භාවයයි. හික්මීමයි. ඉතිං යමෙක් මේ තුන් දොරේ හික්මීම තබා ගන්නවා නම් "නතේ ගමිස්සන්ති අපායං" එබඳු අය අපායට යන්නේ නැහැ කියල බුදුරජාණන් වහන්සේ දේශනා කළා. ඒවගේම සිල්වතාට ලැබෙන ආනිශංස පහක් බණ පොතේ සඳහන් වෙනවා. ඒ තමයි සිල්වත් කෙනාට බොහෝ භෝග සම්පත් ලැබෙනවා. පිරිසුදු කීර්තියක් හිමිවනවා. ඒ වගේම කවර, තරාතිරමේ පිරිසක් ළඟට වුවත් බියෙන් තොරව යාමට පුළුවන ආත්ම ශක්තියක් ඔහුට ලැබෙනවා. එසේම සිල්වත් කෙනා සිහිනුවණින් කළුරිය කරනවා. අවසාන ආනිශංසය තමයි. මරණින් පසු දේව ලෝකවල උප්පත්තිය ලබනවා. සිල් රැකීමේ ආනිශංස බලවත්. ඒ නිසා මෙලොව දියුණුව සේ ම පරලොව දියුණුව ද පතන්නෝ සිල් ආරක්ෂා කිරීමට උත්සාහවන්ත විය යුතු ම යි.

මීළඟට දියුණුවීමට හේතු වන තුන්වැනි කරුණ තමයි බුද්ධානු මතං වැඩිහිටියන්ගේ අනුශාසනා පිළිගැනීම කියන්නේ. අප වැඩිහිටියන් හැටියට සලකන්නේ අපේ භික්ෂූන් වහන්සේ මව්පියන්, ගුරුවරුන්, සහ ගුණයෙන් උසස් අයයි.

වැඩිහිටියන් යම් වැරැදි දෙයක් පිළිබඳව නම් අවවාද කරන්නේ, එය කරන්නේ ප්‍රත්‍යක්ෂ අවබෝධයකින් එහි ඇති බරපතළකම වටහාගෙන යි.

මෙතැනදී අපට අපේ රාහුල පොඩි හාමුදුරුවන්ගේ ආදර්ශය ඉතාම වටිනවා. මොකද? රාහුල පොඩි හාමුදුරුවෝ හැමදා ම උදේ අවදිවෙලා මිදුලට බැහැලා මුලින් කරන්නේ වැලි දෝතක් අරගෙන උඩ දමලා මේ වැලි කැට ගණනට අද දවසේ දී මට අවවාද ලැබේවා කියලා ප්‍රාර්ථනා කිරීමයි. ඒ නිසා දියුණුවන අය රාහුල පොඩි හාමුදුරුවෝ ආදර්ශයට අරගෙන වැඩිහිටි අයගේ අවවාද අරගෙන, තම ජීවිතය දියුණුකර ගන්න උත්සාහ කරන්න ඕනෑ. මේ දියුණුවීමට හේතුවන තුන්වැනි කාරණයයි.

සිව්වැනි කාරණය තමයි ‘සුතංච’ උගත්කම කියන්නේ. මෙය දියුණුවීමට බලාපොරොත්තු වන හැම කෙනකුට ම අත්‍යවශ්‍ය දෙයක්. අද අප ජීවත් වන ලෝකය මොහොතින් මොහොත දියුණුව කරා ගමන් කරනවා.

අනාගතයේ මොන තත්ත්වයක් උදාවේ දැයි කිව නොහැකියි. ඒනිසා දියුණු වන සමාජයත් සමඟ කටයුතු කිරීමට ඉදිරියට යන්න.

ඒ සමඟ අපට උගත්කම අවශ්‍යයි. ඒ නිසා නිසි අවධිවල අධ්‍යාපනය හැදෑරීමත්, දියුණුවට උපයෝගී වනවා. බොහෝ දෙනාගේ ඉගෙනීමේ පරමාර්ථය රැකියාවක් ලබා ගැනීමයි. රැකියාවක් කිරීම වරදක් නොවෙයි. ඒත් ඉගෙනීම එයටට ම සීමා කිරීම හොඳ නැහැ. ඉගෙනීමෙන් බලාපොරොත්තු වන්නේ හොඳ, යහපත්, ගුණ ගරුක, හැදිච්ච කමක් ඇති ජීවිතයක් ගත කරන්න අවශ්‍ය පරිසරයක් ඇති කර ගැනීමයි. හැදිච්චකමක් නැති අධ්‍යාපනයෙන් වැඩක් නැහැ.

අපේ අම්මලා තාත්තලා දැන් පටන් ම මොන විදිහේ අධ්‍යාපනයක් තම දරුවන්ට දුන්නත් කමක් නැහැ හැදිච්චකම ඇතිකරගෙන.එවිටයි නියම උගතුන් බිහිවන්නේ. එවැනි උගතුන්ගෙන් රටට විශාල සේවාවක් ලැබෙනවා.

ධම්මානුවත්තී ච ඒ කියන්නේ දැහැමි ජීවත්වීම යන්නයි. අද සමාජයේ දකින්න ලැබෙන දුර්ලභ කරුණක් තමයි ධාර්මික අය සොයන එක අපේ බුදුහාමුදුරුවෝ බෞද්ධයකුට නොගැළපෙන නොකළයුතු රැකියාවන් පහක් දේශනා කළා. ඒවා තමයි මස් පිණිස සතුන් වෙළඳාම, අවි ආයුධ වෙළඳාම, වස විෂ වෙළඳාම, වහල් වෙළඳාම කියන්නේ. මේවා අධර්මිෂ්ඨ රැකියාවන්.

මෙවන් රැකියාවන් කරමින් උපයන ධනය අධර්මිෂ්ඨව උපයන ලද ධනයක්. ඒත් අද සමහරු බහුල වශයෙනන් ධනය උපයන මර්ග හැටියට යොදාගන්නේ එවැනි දේවල්මයි.

ඒත් එවැනි දුෂ්චරිත වැරැදි දේ කරලා ධනය උපයන අයට කොපමණ ධනය තිබ්බත් හිතට එකඟව සතුටු වන්නට බැහැ. අනේ මං මේ ධනය උපයා ගත්තේ කොපමණ නම් පවුල් අවුල් කරලද? ජීවිත කීයක් විනාශ කරල ද? මේ විදිහට හිතෙන මත්පැන් ආදී වෙළඳාම් කරපු අයට ධනය තිබුණාට සතුටක් නැහැ. පින්වතුනි, සල්ලි තිබුණාට සතුට ලැබෙන්නේ නැහැ. සන්තුට්ඨී පරමං ධනං අපේ බුදුහාමුදුරුවෝ දේශනා කළේ සතුට උතුම්ම ධනය කියලයි. අධාර්මික රැකියාවලින් ඉක්මනට ලාභ ලැබෙන බව ඇත්ත. ඒත් අපි ලාභ ලබනවාට වඩා දුර බලන්න පුරුදු වන්න ඕනෑ. ඒවගේ ම අධාර්මිකයාගේ දියුණුව තාවකාලිකයි. හරියට අත්තිවාරම ශක්තිමත් නැති නිවසක් වගේ. මොකද? එවන් ගෙවල් කොච්චර ලස්සන වුණත් ඉක්මනට කඩාවැටෙනවා. හැබැයි ධාර්මිකයා එහෙම නොවෙයි හැමදාම නොසෙල් වී පවතිනවා.

දියුණුවීමට අවශ්‍ය තවත් කාරණයක් තමයි අලීනතාව කම්මැළි නැති කම. කම්මැළිකම යමකුට තිබේ නම් කවදාවත් ඔහුට දියුණුවීමට පුළුවන් කමක් නැහැ. රැකියාවක් කරන අය, ඉගෙන ගන්න ශිෂ්‍යයන් කියන මේ සමාජයේ කුමන තරාතිරමේ අයකු වුවත් කම්මැළි වුණොත් ඒ හැම දෙනෙක්ම පිරිහීමට පත් වෙනවා.


විශේෂයෙන් ඉගෙන ගන්න අපේ දරුවෙක් අලස වුණොත් කවදාවත් ඉගෙනීමේ උසස් තත්ත්වයකට පත්වීමට හැකියාවක් නැහැ. අනිත් අයත් එහෙමමයි. කරන දේ කුමක් වුවත් අනලස්ව කරන තරමටයි ප්‍රතිඵලය ලැබෙන්නේ. අලසකම පිරිහීමේ ලක්ෂණයක් හැටියටයි. පරාභව සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ දේශනාකර තිබෙන්නේ.

ඒ නිසා දියුණුවෙන්න කැමති අය වීර්යය ඇති කරගෙන ක්‍රියා කරන්න ඕනෑ. එවැනි අයට වාසනාවන්ත ජීවිතයක් ගත කරන්න පුළුවනි.

අපේ සිද්ධාර්ථ බෝධිසත්වයන් වහන්සේ ලොව්තුරු බුද්ධත්වය ලැබුවේ වීර්යයේ ප්‍රතිඵලයක් ලෙසටයි. සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් දම් පිරීම දෙස බලන කල එය පැහැදිලි වෙනවා.

තමාගේ දියුණුව තමා විසින් ම සලසා ගන්න ඕනෑ. එය වෙන අයකුට කළ හැක්කක් නෙමේ. තමන් හිසට තම අතමය සෙවණැල්ල වෙන්නේ. ඒනිසා මේ දියුණුවීමට බලාපොරොත්තු වන අය කම්මැළිකම නැතිකර ගන්න අධිෂ්ඨාන කර ගන්න ඕනෑ. මේ කරුණු හය අපේ ජීවිත තුළ තිබෙනවා නම් අපට මෙලොව වශයෙන් පමණක් නෙමෙයි පරලොව වශයෙනුත් දියුණුවීමට පුළුවනි.

**මීගහවැවේ විමලරතන හිමි**



# සාමයෙන් ජීවත් වන්න තමන් උපමාවට ගෙන අනුන් ගැන සිතන්න

**ආර්ය සංස්කෘතිය, නැති නම් බ්‍රාහ්මණ සංස්කෘතිය භාරතයේ පැතිරයත්ම බ්‍රාහ්මණ ප්‍රභූත්ත්වය ද දියුණු වී ගියේ ය. එහෙයින් සියලු කාර්යයෙහි ප්‍රමුඛත්වය බ්‍රාහ්මණයාට ම හිමි විය. බ්‍රාහ්මණ ඉගැන්වීම් ඔස්සේ ඔවුන් අතර චතුර් වර්ණයක් හෙවත් කුල හතරක් දැක්ක හැකි ය. මේ කුල භේදයේ ආරම්භය ආර්ය, අනාර්ය භේදය පදනම් කොට ඇත්තෙකි.**

උපනිවේශීන් හැටියට ඉන්දියාවට පැමිණි ආර්යයෝ එහි ස්වදේශිකයන් යටපත් කොට තමන්ගේ බලය තහවුරු කර ගත්හ. ආර්යයන් බලයට පත් වූ අතර, යටත් වූ ස්වදේශිකයන් දාසියන් හැටියට සලකා ඔවුන් "දස්‍යු" නාමයෙන් හැඳින්වූහ. මේ තත්ත්වය පිළිබඳ මහාචාර්ය රැප්සන් මහත්මා මෙසේ සඳහන් කරයි.

ජය ගත් මිනිසාත් පැරැදුණු මිනිසාත්, අතර ප්‍රාථමික භේදය ප්‍රකට ව පෙනෙන්නට වුයේ වර්ණයෙනි. එහෙයින් සංස්කෘත වර්ණ ශබ්දය කුලය හා පාට යන දෙකට ම සාධාරණ ව යොදා ඇත. මෙසේ භාරතීය සමාජයේ මුලින් ම දක්නට ඇත්තේ වර්ණ භේදය යි.

මුල් යුගයේ ආර්යයන් අතර යම් යම් ගෝත්‍ර භේදාදියක් තිබුණ ද, නැත ද ඔවුන් අතර මහත් සමගියක් තිබිණ. එක ම සංවිධානයක සාමාජිකයන් වශයෙන් ඔවුහු ජීවත් වූහ. සමාජයේ දියුණුවත්, ආර්යයන් ගේ ව්‍යාප්තියත් සමඟ ම සාමාජික අවශ්‍යතාවයන් ඔස්සේ ඔවුනොවුන්ගේ ජීවනෝපායනට අනුරූපව කොටස් වන්නට විය. එහෙයින් පූජකයා බ්‍රාහ්මණයා වූ අතර, පාලකයා ක්ෂත්‍රියයා විය. කෘෂි වණිග් ආදී කර්මාන්තයන්හි යෙදුණෝ වෛශ්‍යයෝ වූහ. මුල් යුගයෙහි දී දසයුන් හැටියට සැලකූවන් ශුද්‍ර නාමයෙන් හඳුන්වන්නට විය.

මෙසේ එදා සමාජයේ වුවමනාවන් අනුව හැඩ ගැසුණු සමාජයීය ආයතනයක් වූ කුල භේදය බුද්ධකාලීන සමාජයේ දී අමුතුම මුහුණුවරකින් දක්නට ලැබේ.

සමාජය දියුණුවත් ම කුල භේදය ද දියුණු තියුණු විය. සමාජයේ ඒ ඒ කර්තව්‍යයන්හි යෙදුනවුන් ද උස් පහත් වශයෙන් සලකන්නට ඇතැයි සිතීමට තුඩු දෙන්නකි. "හීනසිප්ප" යන වචනය, එදා සමාජයේ ඇතැම් දේ පිළිබඳ යම් යම් සම්මතයන් තිබූ අතර, ඒවායින් පහත් සේ සම්මත ක්‍රියාවන්හි යෙදුණු අයවලුන් පහත් කොට සලකන්නට ඇත.

බුද්ධ කාලීන සමාජයේ කුලභේදය මිනිසාගේ පීඩනයට කරුණෙක් විය. සෙසු කුලවල අය බ්‍රාහ්මණ ආධිපත්‍යයෙන් මිරිකී සිටි බැව් පෙනේ. එහෙයින් ම බුදුන් වහන්සේ උත්පත්තියෙන් ම බ්‍රාහ්මණයෙක් නො වන්නේ යැයි දක්වමින් බ්‍රාහ්මණ වාදයට පහර ගැසූහ.

එහෙයින් කවර වංශයක වුව ද රහතන් වහන්සේ ම ශ්‍රේෂ්ඨ බව දැක්වූහ. ගුණ ධර්මයට, සදාචාරයට මුල් තැන දුන් හ. සමාජයේ බලපැවැත් වූ චතුර් වර්ණය වෙනුවට උන් වහන්සේ අලුත් සිව් පිරිසක් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා නමින් ඉදිරිපත් කළහ. එහෙයින් ශාසනය තුළ කුල වාදයට ඉඩක් නො වී ය. එසුකාරී සූත්‍රයෙහි දී,



"ඛත්තිය කුලාවෙපි අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො ච තථාගතප්පවෙදිතං ධම්ම විනයං ආගම්ම පාණාතිපාතා පටිවිරතො හොති, පෙ ධම්මං කුසලං බ්‍රාහ්මණ කුලාවෙපි. පෙ, වෙස්ස කුලාවෙපි සුද්ද කුලාවෙපි ධම්මං කුසලං"

යන්නෙන් සදාචාරාත්මක වශයෙන් උන්වහන්සේ සැලකූහ.

මධුර සූත්‍රයෙහි දී ද කුලය අභ්‍යන්තර දියුණුව සඳහා කිසිවක් නො කරන දෙයක් සේ සඳහන් කොට ඇත. ගංගා, යමුනා. අචිරවතී ආදී ගංගාවන්ගේ ජලය සියල්ල මහ මුහුදෙහි දී එක් වන්නා සේ නොයෙක් කුලයෙන් පැවිදි වූවෝ ශාසනයෙහි එක සමාන බවට පත් වෙතියි වදාළහ.

භික්ෂූන් වහන්සේගේ පොදු බව භික්ෂු ජීවිතයේ කැපී පෙනෙනම ලක්ෂණයකි. භික්ෂාවෙහි හැසිරුණු බුදුන් වහන්සේ මෙන් ම ශ්‍රාවකයෝ ද සපදාන චාරිකාවෙහි හැසිරුණහ. ගෙපිළිවෙළින් වඩින විට රජ ගෙදරත්, දුගී පැලත්, සැඬොල් නිවෙසත් එක් පරිදි විය. මෙයිනුදු භික්ෂු ජීවිතයේ සමානාත්මතාවපැහැදිලි වෙයි.

භික්ෂූන්ගේ සමගිතාව වර්ණනය කරන්නේ සම්මොදමානා අවිවදමානා ඛීරෝදකීභූතා යන පදවලිනි. මෙසේ සමගිව, ප්‍රීතිව මහත් බැඳීමකින් යුතුව වසන්නට පදනම වූයේ ද සමානාත්මතාවයි.

ධර්ම දේශනයෙහි දී උපකාර කැරැ ගත් උපමාවන් අතර වූ ආත්මොපමාව ද සමානාත්මතාව ද මතු කැරැ පෙන්වන්නකි. තමා ම උපමාවට ගෙන, අනුන් ද තමා මෙන් ම සලකන්නට හිතන්නට සලස්වන විට සැමදෙනා කෙරෙහිම ඒකාකාර හැඟීමක් මෙන් ම ඒකාකාර පැවැත්මක් ද ඇති වෙයි. තෙමේ දුකට අකමැති වන්නාක් මෙන්, සැපට කැමැති වන්නාක් මෙන් අන්‍යයන් ද එසේ යැයි සිතන්නට හුරුපුරුදු වත් ම අන්‍යෝන්‍ය අවබෝධයත්, සහයෝගයත් නිසා සමානාත්මතාව ද දියුණු වෙයි.

සිව් සඟරාවතෙහි දී සිව්වැනි කරුණ වශයෙන් සමානාත්මතාව දැක්වූහ. දානය එහි පළමුවැන්නයි. දානයෙන් අදහස් කැරෙන්නේ අනුන්ගේ හිත සුව පිණිස




අතිපූජ්‍ය අත්තුඩාවේ සිරි රාහුල මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

ස්වකීය ධනය යෙදවීමයි. තමා මෙන්ම අනික් තැනැත්තේ ද සුවයට පැමිණවීම එහි පරමාර්ථයයි.

ලෝකයේ විවිධත්වයට, අසමානත්වයට හේතුව වශයෙන් බුදුදහම දක්වන්නේ ලෝභ, ද්වේෂ, මෝහයන් ය.

ලෝකයේ ඇති ධන සම්පත් සෑම දෙනාහට ම පොදු ය. සාධාරණ ය. තමන්ගේ ප්‍රමාණයට වඩා, අයිතියට වඩා, යම් කිසිවෙක් ගනී නම් අනෙක් අයගේ කොටස් අඩු වීම නො වැළැක්විය හැකි ය. එහෙයින් පිරිසකට වුවමනාවට වඩා ඇති අතර, සෙස්සන්ට වුවමනා ප්‍රමාණයවත් නො ලැබෙයි. එවිට ඊට හේතු වූයේ කුමක්දැයි විමසන විට පැහැදිලි වන්නේ අවශ්‍ය ප්‍රමාණයට වඩා ගැනීමට පුද්ගලයා පෙලඹවූයේ කුමක්ද යන්නයි. එවිට ලැබෙන පිළිතුර කුමක්ද ආශාව යන්නයි.

මෙසේ සියලුම සාමාජික අරගලයනට. අසහනයනට මෙන් ම සමාජයේ විෂමත්වයට ද මේ ලෝභ, ද්වේෂ, මෝහයන් තුඩු දී ඇති සැටි විමසා දත හැකි ය.

බුදු දහම මේ තුනම බලවත් අකුසල් හැටියට සැලකීමෙන් සාධාරණ අයිතිය සෑම මිනිසකුට ම හිමි බව පිළි ගනියි. එහෙයින් සෑම තැනැත්තා ම සමාජයේ අවයවයක් වන අතර සෑම දෙනාගේ ම එකතුවෙන් සහයෝගයෙන් සමාජය පැවැත්ත යුතුයැ යි පිළිගනී.

එහෙයින් සැම දෙනාගේ අයිතිවාසිකම් සමාන බවත්, සාධාරණ බවත් දකී. එවැනි ඉගැන්වීම් ඔස්සේ බිහි වන සමාජයක සාධාරණතාව රජයන අතර සමානාත්මතාව තහවුරු වෙයි.

"සබ්බේතසන්ති දණ්ඩස්ස,
සබ්බේ භායන්ති මච්චුනො"

සියල්ලෝ ම දඬුවමට බිය වෙතියි දැක්වීමෙන් ජීවත් වීමේ පරමාර්ථය මෙන් ම දුක් නොවිඳීමේ අදහස ද සැම දෙනාගේ පොදු පරමාර්ථය බව පෙන්වා ඇත. සිඟාලෝවාද සූත්‍රයෙහි දී සමාජයේ ඔවුනොවුන්ගේ සම්බන්ධතාව රැක ගත හැක්කේ කෙසේ ද, දියුණු කළ යුත්තේ කෙසේ දැයි විවරණය කොට ඇත. එයද සමාජයේ සමානාත්මතාව දියුණු කිරීමට කළ උත්සාහයකි.

බුදුන් වහන්සේ කුල භේදය තබා සමාජයේ තනතුරු භේදයවත් නොසැලකූහ. ශාක්‍ය කුමාරයන් සමූහයක් සමඟ පැවිදි වූ උපාලි කපුවා මුලින් ම මහණ කිරීමෙන් ආදර්ශයක් දුන්හ.

බිම්බිසාර, කෝසල, අජාතසත්ත වැනි රජවරුන් අතර පුණ්ණ දුගියා, එකසාටක බමුණු වැනි දුගියෝ විශේෂ තැනක් ගත් හ.

සෝපාක සුනීත වැනි පහත් යැයි සම්මත කුලවල පැවිදි වූවෝ රහත් බවින් සැනසුණෝ වූහ. භික්ෂුණී ශාසනය ඇති කිරීමෙන් පසු කාන්තාවනට ද පැවිදි වීමේ අවස්ථාව සැලසිණි.

"යස්ස එතාදිසං යානං
ඉත්ථියා පුරිසස්සවා
සවෙ එතෙන යානෙන
නිබ්බානස්ස සන්තිකෙ"

යන්නෙන් ස්ත්‍රියක හෝ වේවා, පුරුෂයකු හෝ වේවා ගුණගරුක වූයේ, සත්‍යය අවබෝධ කරන්නේ යැයි උන් වහන්සේ වදාළහ.

භික්ෂුණී ශාසනයට ඇතුළත්වූ බොහෝ දෙනා අතර ඉතාමත් දුගී අය වූහ. අම්බපාලී, විමලා ආදී ගණිකාවෝ ද ඒ අය අතර වූහ.

සමාජයේ කවර මිණුම් දණ්ඩෙන් මිණුව ද උන්වහන්සේ සෑම කෙනෙක් ම එක හා සමාන කොට සැලකූහ.

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## ඉල් අමාවක 2022-11-23

# මනස පුබුදන නැණස පාදමු

දුර අරමුණ කරා ගමන් කරන, හුදකලාව හැසිරෙන, සිරුරක් නැත්තා වූ, ශරීර නමැති ගුහාවෙහි නිදන සිත යම් කෙනකු තැන්පත් කර ගනිත් ද, ඔහු සසර පැවැත්මෙන් මිදෙන බව ධම්ම පදයෙහි සඳහන් ය.

මේ අනුව සිත එකඟ කර ගැනීමේ ඒකායන මාර්ගය භාවනාව යි. එය මෙලොව හා පරලොව යන දෙලොව දියුණුව සඳහාම හේතුවනු ඇත. ප්‍රධාන භාවනා ක්‍රම දෙක අතර සමථ භාවනාවෙන් තැන්පත්කම හා එකඟකම පිළිබඳ දියුණුව ද, විදර්ශනා භාවනාවෙන් නුවණ දියුණු කරගැනීම ද මැනවින් සිදුකරගත හැකි ය. භාවනාව පිළිබඳ කරුණු සොයා යාමේ දී කායානුපස්සනාවට සුවිශේෂී ස්ථානයක් හිමි වෙයි. කය අනුව සිතීම, වේදනාව අනුව සිතීම, සිත අනුව සිතීම සහ ධර්මය අනුව සිතීම එමඟින් සිදු වෙයි.

කායානුපස්සනාවට ම අයත් ආනාපානසති භාවනාව ඉතා සරල හා පහසු භාවනා ක්‍රමයකි. හුස්ම ගැනීම හා පිට කිරීම මුල් කරගෙන සිහිය පිහිටුවා ගැනීම එමඟින් සිදු කෙරෙයි. එය අපගේ ශරීර සෞඛ්‍යයට ද, විවේකයට ද, හොඳ නින්දක් ලබා ගැනීමට ද දිනපතා වැඩ කටයුතු හොඳින් කර ගැනීමට ද බෙහෙවින් ම උපකාරී වෙයි. එයින් සිතට සාමය හා සැනසිල්ල ලැබේ. සිත කැළඹී තිබෙන අවස්ථාවක මිනිත්තු කිහිපයක් මෙම භාවනාව ප්‍රගුණ කළහොත් වහාම සිත සන්සිඳෙයි.

තමා මෙන්ම අන්‍යයෝ ද නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා ආදී වශයෙන් මෛත්‍රිය අනුන් කෙරෙහි නැවත නැවත පැතිරවීම මෛත්‍රී භාවනාව යි. සත්ත්වයන් කෙරෙහි යහපත ප්‍රාර්ථනා කිරීම මෙන්ම අනර්ථයක්, අයහපතක්, විපතක්, අලාභයක්, අපහාසයක්, අයසක් නොවේවා යි, ප්‍රාර්ථනා කිරීම ද මෛත්‍රිය යි. ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් හා මෝහයෙන් තොරව මෙත් සිත පතුරුවාලිය හැක්කේ එක්තරා ක්‍රමයකට සකස් වූ මනසක් ඇත්තෙකුට ය.

මහානාම නම් ශාක්‍ය පුත්‍රයාගේ විමසීමකට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ ආර්ය ශ්‍රාවකයා නිතර අනුස්සති භාවනා වඩන බවත්, මනසින් එය නිතර සිහි කරන බවත් වදාළහ. නව අරහාදී බුදුගුණ සිහිකිරීම ධර්මයෙහි විශේෂතාව සිහි කිරීම, භික්ෂූන් වහන්සේගේ සුපටිපන්නාදී ගුණ මෙනෙහි කිරීම, සීලය ගැන මෙනෙහි කිරීම, ත්‍යාගී ගුණය මෙනෙහි කිරීම, දේව කායික තත්ත්වයට යෝග්‍ය වූ ගුණ මෙනෙහි කිරීම මෙම අනුස්සති භාවනාවට ඇතුළත් ය. මෙමඟින් රාගය, ද්වේෂය, මෝහය යන අකුසල මූල යටපත් කර සිත එකඟතාවට පත් කරයි. එය වඩන පුද්ගලයා ධර්මය දැනගෙන ධර්ම ප්‍රමෝදයට පත් වී සොම්නසට පැමිණ කයෙහි සංසිඳීම නිසා සැපතට පත් වෙයි. සැපතට පත්ව චිත්ත සමාධියට පැමිණෙයි.

මෑතක දී බ්‍රිතාන්‍යයේ විද්‍යාඥයන් කිහිප දෙනකු විසින් කරන ලද පර්යේෂණවලින් තහවුරු වූ කරුණක් නම් මිනිසා තුළ ඇතිවන රෝග භාවනා මාර්ගයෙන් බොහෝ දුරට සමනය කරගත හැකි බවයි. මීට හේතු වශයෙන් ඔවුන් දක්වා ඇත්තේ භාවනාවේ දී මිනිසා තුළ ශාරීරික වශයෙන් මෙන් ම මානසික වශයෙන් ද ඇතිවන පරිවර්තනය යි.

# සසර දුක් ගිනි නිවන්න සැදැහැ සිතින් සිල් රකින්න



**බොහෝ ධන ධාන්‍ය සම්පත්තියෙන් නොයෙක් අතින් සංවර්ධිත සුරට්ඨ නම් ජනපදයක් විය. එහි සිල්වත් භික්ෂූන් වැඩ වසන විහාරයකි. මහා නිධි පර්වතය අසල ධුතාංගධාරී යෝගාවචර භික්ෂූන් වහන්සේ වැඩ වාසය කරති.**

උන්වහන්සේ උදය වරුවෙහි පිණ්ඩපාතය වැඩ, දානය සපයාගෙන විත් තැනක තැබූ සේක. සොරකම ජීවනෝපාය කර ගත් මහා හොරෙක් රැයෙහි සොරකම් කොට පිපාසාවෙන් හා කුසගින්නෙන් පීඩිතව විහාරයට ගියේ ය. හේ යට කී පිණ්ඩපාතය දකියි.

"ෂා පිණ්ඩපාත දානය! හාමුදුරුවෝ මින් කොටසක් නොදී වැළඳුවොත් මම රෑට ඇවිත් මුන් වහන්සේගේ සිවුරු හා පාත්‍ර සොරකම් කරනවා."

ස්වාමීන් වහන්සේ අත් පා සෝදා ගෙන චෛත්‍ය රාජයාණන් වහන්සේ වැඳ දානය වැළඳීම සඳහා සූදානම් වූහ. සොරාගේ පැමිණීම උන්වහන්සේ දුටුවහ.

"එන්න, මේ ආහාර අනුභව කරන්න." සොරා ආහාර අනුභව කළේ ය.

" ස්වාමීන් වහන්ස මම භයානක සොරෙක්මි. මට ආහාර ස්වල්පයක් දුන්නේ නැත්නම් මම ඔබ වහන්සේට අපරාධයක් කරන්නට සිතුවෙමි. ඔබ වහන්සේ මට ඒ ගැන සමාව දෙනු මැනවි."

"හොඳයි, මම ඔබට ඒ ගැන සමාව දෙමි. ඉදින් මා කියන දේ කරනවා නම්. පන්සිල් රකින්න.

"ස්වාමීන් වහන්ස පන්සිල් කියන්නෙ" මොනවද?

"පන්සිල් කියන්නෙ සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරු කීම, රහ මෙර පානය යන පහ නොකිරීමයි." පවසමින් පන්සිල් ගැන විස්තර කර දුන්හ.

"අනේ ස්වාමීනි, මේ පහ බරපතළයි. මට නම් ඔය පහක් රකින්න හරි අමාරු වැඩක් නෙ.

එහෙම නෙමෙයි, ඔබ හතරක් රකින්න."

"හපෝ බැහැ. ස්වාමීනි."

"හරි, එහෙනම් තුනක් රකින්න."

"ඒත් මට නම් බැහැ ඒක කරන්න."

"හරි, දෙකක් බැරි ද? දෙකක් රකින්න."

"ස්වාමීන් වහන්ස, දෙකකුත් බැහැ. එකක් නම් මම රකින්නම්."

"සතුටුයි පින්වත. ඔබ කුමන ශික්ෂා පදය ද රකින්නේ?

ඔය කිව්ව ඒවායින් තුන්වන ශික්ෂාපදය. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම.

"හොඳයි පරදාර සේවනයෙන් වැළකී සිටීමට පොරොන්දු වෙනවා."

සොරා ස්වාමීන් වහන්සේට වැඳ නික්ම ගියේ ය.

පරදාර සේවනයෙන් වැළකීම තමන් විසින් ආරක්ෂා කිරීමේ තිර අදිටන ඔහු තුළ විය. ඔහු වෙනදා මෙන් සොරකම කරන්නට විය. දිනක් රෑ සොරකමේ යන විට බොහොම වටිනා ගොනුන් තුන් දෙනකු ගෙදරක සිටිනු පෙනිණ. මහ රෑ ගෙට ඇතුළු වූ සොරා ගෙදර කාන්තාව දුටුවා ය. දුටු සැණෙන් ම ඇයට සොරා පිළිබඳ සිත් පහළ විය.

"තරුණයා, ඇයි මේ ගෙට ඇතුළු වුණේ." "මේ ගෙදර හොඳ ගවයින් තුන් දෙනෙක් ඉන්නවා. උන් අරන් යන්නයි ආවේ."

"හා හා තරුණය, ඔබ මා කියන දෙයක් කරනවා නම්, ඔය ගොනුන් තුන් දෙනා විතරක් නෙමෙයි ඔබට කැමැති ඕනෑම දෙයක් දෙන්නම්."

"හොඳයි මොනවද මගෙන් කෙරෙන්න ඕන.?"

වෙන මොනවත් නොවෙයි. මා කාම සැපයෙන් සතුටු කරන්න. කාම රසයෙන් පෙළඹුණ අය යුද්ධයට බැඳීම. ජලයට පිවිසීම, සොරුන් අතරට යාම, මහා වනයට ඇතුළු වීම. පර්වත දුර්ගයකට පිවිසීම ආදිය ගණන් නොගනියි. මා කම් සැපයෙන් සතුටු කරන්න. ඒ විදියට කළොත් ඔබගේ පැමිණීම සාර්ථකයි. ඔබ කැමැති දේවල් ගෙනියන්න පුළුවන්."

"මොනවද ඔබ මේ කියන්නේ? මට ඔය කතා අහන්නවත් ඕන නෑ. මම ශීලයක් රකිනවා.

ගෘහණියගේ ද සොරාගේ ද මේ සංවාදය ගෙදර හිමියා අසා සිටියි. මුරකරුවන් කැඳවා සොරා අල්ලාගෙන ගැහැනියගේ අත්පා බැඳ දැමීය.

"තරුණය. මම ඔබට අද සිට මගේ සහෝදරයෙක් සේ සලකනවා. මේ ගෙදර ඕනෑම දෙයක් ගෙනියන්න. මේ සටකපට ගැහැනිය මම ගෙදරින් පන්නා දානව."

හොරා විස්මිතව කල්පනා කරන්නට ය." "මම හොරෙක්. ගොනුන් ගෙනියන්න ඇතුළු වුණේ. පරදාර සේවනයෙන් වැළකුණු නිසා එක මොහොතින් මහා සම්පත් ලැබුණා. ගොනුන් විතරක් නොවෙයි, හොඳ යාළුවෙකුත් ලැබුණා. මිය යන්න ඕන තැන ජීවිතය ලැබුණා. මේ ඔක්කොම එකම එක සිල්පදයක් රැකලයි. සිල්පද පහ රකින අයට මොනතරම් මහත් ඵල ලැබෙනවා ඇත්ද? කුසගින්නේ පෙළුණු මම ස්වාමීන් වහන්සේ නමකගේ බුද්ධ ශ්‍රාවක කෙනෙකුගෙන් එක් සිල්පදයක් සමාදන් වුණා. ලේ තැවරුණු අත් ඇති නපුරු දුෂ්ට සොරකු විසින් ආරක්ෂා කළ ශීලය මෙලෙස පල ලබා දුන්නා. යමෙක් ශ්‍රද්ධාවෙන් සිල් රකයි නම්, ඒ ශිලයෙහි පිහිටි ඔහු හැම භයින්ම මිදෙනවා. මෙම දැඩි සිතින් සිල් රකිමි.

සොරා නැවත භික්ෂූන් වහන්සේ හමුවීමට ගියා ස්වාමීන් වහන්සේට වැඳ එකත් පස්ව මෙසේ කියන්නට වුණා.

ස්වාමීන් වහන්ස, මට සිල්පද පහම දෙනු මැනවි. ඒ පන්සිල් මගේ ජීවිතාන්තය දක්වාම රකිනවා. ඔබ වහන්සේගෙන් ගත් එක සිල්පදය පරදාර සේවනයෙන් වැළකීම මම රැක්කා. ඒක නිසාම මම මරණ භයින් නිදහස් වුණා. දැන් දුගතියෙහි ඇති මහත් දුක ගැන අසන්න කැමැත්තෙමි. මහා වීරයන් වහන්ස, කැපකරුවූ මා දුගතියෙන් මුදවාලනු මැනවි. කුස ගින්නේ සිටි මට ඔබ වහන්සේ එදා ආහාර දුන්නා. අද සසර දුකෙන් පෙළෙන මට සිල් දෙනු මැනවි. ස්වාමීන් වහන්ස.

හොඳයි සත්පුරුෂය, මම ඔබට තිසරණ සරණයද, සිල් ද දෙමි. ශීලවන්ත මනුෂ්‍යයා, මිනිසුන් ද නොමිනිසුන් ද තිරිසනුන් ද කියන සියලු දෙනා විසින් විශ්වාස කටයුත්තක් වෙයි. ඒවා රැක දුගතියෙන් මිදෙන්න. ඒවා ඔබට දිව්‍ය සම්පත්, මනුෂ්‍ය සම්පත්, ආර්ය සම්පත් ලැබීමට හේතු වෙනවා."

තරුණයාට මහත් සතුටු ය.

වැඳගෙන තිසරණ සරණය ද, සිල් ද ස්වාමීන් වහන්සේගෙන් ලබා ගත්තා. සිල් රකිමින් පාපි ක්‍රියාවන් මුළුමනින් ම දුරුකොට ධර්ම ප්‍රීතිය ම ප්‍රිය කොට උපාසකයෙක් වුණා.

පින්වතුනි,

එක් සිල්පදයක් නිසි ලෙස රැකීමෙන් දුෂ්ට හොරෙක් ලද ප්‍රතිඵල බලනු මැනවි. සිල්පද පහම රැක්කොත් ප්‍රතිඵල කෙසේ වේද? ඒ නිසා නිවන් කැමැත්තන් විසින් ශීලයෙහි අනුහස් දැන ශීලය හරියාකාරව අවබෝධයෙන් යුතුව ආරක්ෂා කර ගැනීම වැදගත් බව සිතට ගන්න.

සාහිත්‍ය කීර්ති, ආචාර්ය
**සිරිපාල මාදුවගේ**

# ගෞරවය රැකෙන ලෙස දරුවන් හසුරුවන්න

**ප්‍රවුල් සංස්ථාවේ උසස්ම සම්බන්ධය මව්පිය දූදරු සම්බන්ධයයි. එය යුතුකමක්, වගකීමක්, අයිතිවාසිකමක් වශයෙන් එකිනෙකට බැඳී පවතී.**

මවුපියන්ට සැලකීම දරුවන්ගේ යුතුකමක්, වගකීමක් වන අතර, එය ලබා ගැනීමට අයිතියක් මවුපියන්ට ඇත.

දරුවන්ට සැලකීම මවුපියන්ගේ යුතුකමක්, වගකීමක් වන අතර, දරුවන්ට එය ලබා ගැනීමට අයිතියක් ඇත.

දරුවන්ගේ අවශ්‍යතා කුඩා කාලයේ සිටම සපුරන්නේ මවුපියන් විසිනි. දරුවන්ට ඒවා දීමට අසල්වාසින් බැඳී නොසිටින බැවින් අසල්වාසීන්ගෙන් ඒවා ඉල්ලීමට ද නොහැකි ය. මව්පියන්ගෙන් ම ඉල්ලන අතර, ඔවුන්ම එය සපුරාලිය යුතු ය. එසේ වන්නේ ඒ සඳහා යුතුකම් අයිතිවාසිකම් හා වගකීම්වලින් ඒ දෙපක්ෂයට පැන යා නොහැකි අන්දමින් ඔවුනොවුන් බැඳී පවතින නිසා ය.

දස මාසයක් කුස දරා, ලේ කිරි කර පොවන අම්මාත්, සියලු දුක සැප සොයා බලමින් අවශ්‍යතා සපුරාලමින් වර්ධනය කරන තාත්තාත් හැර උතුම් වස්තූන් දෙකක් දරුවන්ට ලොව නැත. දරුවන් වෙනුවෙන් මවුපියන් තුළ ඇතිවන ආදර සෙනෙහස තරම් බන්ධනයක් තවත් නැත.

ගත පුරා දිවයන රක්ත වර්ණ රුධිරය සුදුවන් කිරට හැරෙන්නේ ඒ නිසා ය. තමා නොකා නොබී, සියලු සැප පහසුකම් තම දරුවාගේ පා දූවිල්ලක් බවට පත්කොට දිවි නොතකා දරුවන් ආදරයෙන් සොයා බලමින් හදා වඩා ගන්නේ දරු සෙනෙහස නිසාම ය.

ගෞතම බුදුරජාණන් වහන්සේ මුල්වරට බුදු බව පැතුවේ සිය මව නිසා ය. නැඟී ගිය නැව විනාශ වූ තැන ලෑල්ලක් මත නැඟුණු මහ බෝසතාණන් වහන්සේ මව කරපිට තබාගෙන ගොඩබිමක්, තෙරක් නොපෙනෙන මහ සයුරේ දින හතක් නිරාහාරව පිහිනූ බව මාතුපෝසක ජාතක කථාවේ දැක්වේ.

මවු සෙනෙහසේ බලමහිමයෙන්, දෙවියන්ගේ ආධාරයෙන් ගොඩබිමට ආ විගසම ආදරයෙන් උතුරාගිය අම්මා ආසිරි පැතුවේ ලොව්තුරා බුදු බව ම ලැබේවා කියා ය. "පුතේ උඹ බුදුවෙයන්" කියා කී ඒ වචනය බුදු බව පිණිස කළ මුල්ම ප්‍රාර්ථනාව විය. දරුවන් හා මවුපියන් අතර පවත්නා ආදරය, බැඳීම මෙයින් මැනවින් පිළිබිඹු වේ.

දරුවන් ජීවිතයට හුරුකරවීමේ මූලික පාඩම උගන්වන්නේ මවුපියන් ය. කන, බොන, අඳින පළඳින කතා බස් කරන හැටි දරුවන්ට කියා දෙන්නේත්, හොඳ නරක දැනමුතුකම් උගන්වන්නේත්, නෑ හිතමිතුරන්ට හඳුන්වා දී සමාජයට හුරු කරන්නේත් මවුපියන් විසිනි. ඒ නිසා මවුපියන් "පුබ්බාචරිය" නමින් හඳුන්වයි. පූර්වාචර්ය හෙවත් මුල්ම ගුරුවරු යනු එහි අර්ථයයි.

"මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා" යන සතරවිධ මනෝභාවයන් මහ බ්‍රහ්ම ප්‍රජාව දෙස යොමු කරයි. මේවා සිව්බඹ විහරණ නමින් හඳුන්වයි. දරුවන් වෙනුවෙන් මවුපියන් තුළ ද මේ සිව්බඹ විහරණය අඛණ්ඩව පවතින බව සිඟාලෝවාද සූත්‍රයේ දැක්වේ. මේ නිසා මවුපියන් දරුවන්ට බ්‍රහ්මයකු වැනි ය. "බ්‍රහ්මාති මාතා පිතරෝ"


දක්ෂිණාව පිරිනැමීමට නියම සුදුස්සෝ නම් බුදු, පසේබුදු, මහරහත් ආදි කෙලෙස් නැසූ උත්තමයන් ය. දරුවන් දෙන දක්ෂිණාව පිළිගැනීමට මවුපියන් සුදුසු බව දේශනා කරන බුදුරජාණන් වහන්සේ මවුපියන් "දක්ඛිණෙය්‍ය" යන වචනයෙන් හඳුන්වන අතර, ඒ කාර්යයේ දී මවුපියන් බුද්ධාදී උතුමන්ගේ තත්ත්වයට පත් කරයි.

මවුපියන්ගේ ශ්‍රේෂ්ඨ බව තේරුම් ගැනීමට වඩාත් වැදගත් වන කරුණක් තිබේ. සාමාන්‍යයෙන් මනුෂ්‍යයකු මැරීම අකුසල කර්මයකි.

දරුවන් වෙනුවෙන් ලොව ඇති බරපතළ ම අකුසල කර්මය බවට මව්පියන් මැරීම ආනන්තරීය පාපයක් ලෙස දක්වා ඇත. මියගිය මොහොතේම අවීචි නිරයේ උපත ලබන්නට සිදු වෙයි. ආනන්තරීය පාපකර්ම පහක් පෙන්වන බුදුසමය නියත වශයෙන්ම එහි විපාකය ඊළඟ භවයේ දී අපාගතවීම වන අතර, එය වැළැක්වීමට බුදුවරයකුටත් කළ නොහැකි මහත් ගත අකුසල කර්මයකි.

මෙවන් ශ්‍රේෂ්ඨත්වයට පත් මවුපියන්ට දරුවන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් පහක් සිඟාලෝවාද සූත්‍රයේ පෙන්වා දී ඇත. එම යුතුකම් ඉටුකිරීමට දරුවන් බැඳී සිටින අතර, ඒවා ලබා ගැනීමේ අයිතිය මවුපියන්ට ඇත.

> **"දරුවන් ජීවිතයට හුරුකරවීමේ මූලික පාඩම උගන්වන්නේ මවුපියන් ය. කන, බොන, අඳින පළඳින කතා බස් කරන හැටි දරුවන්ට කියා දෙන්නේත්, හොඳ නරක දැනමුතුකම් උගන්වන්නේත්, නෑ හිතමිතුරන්ට හඳුන්වා දී සමාජයට හුරු කරන්නේත් මවුපියන් විසිනි. ඒ නිසා මවුපියන් "පුබ්බාචරිය" නමින් හඳුන්වයි."**



වයස්ගත මවුපියන් පෝෂණය කොට රැක ගැනීම, මවුපියන්ගේ සියලු අවශ්‍යතා කටයුතු ඉටුකිරීම, කුල පරපුර පවත්වා ගෙන යාම, දායාද රැක ගැනීම, මවුපියන් මියගිය පසු පින් අනුමෝදන් කිරීම, මවුපියන්ට මෙම යුතුකම් ඉටුකිරීමට මානව ධර්මයෙන් මෙන්ම නීතියෙන් ද දරුවෝ බැඳී සිටිති. ඒවා දරුවන්ගෙන් ලබා ගැනීමට අයිතියක් මවුපියන්ට ද ඇත. කුඩා කාලයේ සිට කවා පොවා රැකගෙන උගන්වා හොඳ පුරවැසියන් කර ආවාහ විවාහාදිය ද සිදුකර දුන් මවුපියන් වයස්ගත වූ පසු රැකබලා ගැනීමේ විශේෂ අයිතියක් දරුවන්ට ඇත.

දරුවන්ගෙන් සැලකිලි වන්දනාමාන ගෞරව ලබන්නට හැකිවන පරිදි මවුපියෝ සුදුස්සන් විය යුතු ය.

මාතෘත්වයේ සහ පීතෘත්වයේ ගෞරවය රැකෙන පරිදි පැවැත්ම සකසා ගත යුතු ය. දරුවන් මෙලොවට බිහිකළ පමණින් කවා පොවා හදාගත් පමණින් එය සම්පූර්ණ නොවේ. මව්පියන් ඊට වඩා වැඩිමනක් දෙයක් කළ යුතුව ඇත.

දරුවන් පාපයෙන් වැළැක්වීම, දරුවන් යහපතෙහි යෙදවීම, දරුවන්ට ඉගැන්වීම, සුදුසුම කාලයේ ආවාහ විවාහ කරදීම හා තමනට අයත් ධනය සම්පත් දායාද නිසි කල නිසි ලෙස පවරා දීම බුදු සමය පෙන්වා දී ඇත.

මවුපියන් කෙරෙහි දරුවන් විසින් පිළිපැදිය යුතු පිළිවෙළ දහමේ දක්වා තිබේ.

මව්පියන්ට දරුවන් නමස්කාර කළ යුතු ය. ආහාරපාන, සයන ආදියෙන් ද ඇඟ ඉලීමෙන්, නෑවීමෙන් පා සේදීමෙන් සත්කාර කළ යුතුය.

මව්පියන් දරුවන්ට කළ උපකාර ලෝකයේ කිසිවකු කර නැති බැවින් දරුවන් මවුපියන්ට ණයකාරයෝ ය. එම ණයින් නිදහස්වීම එතරම් පහසු ද නැත. එම ණයෙන් යම් පමණින් නිදහස් වීමට නම් දරුවන් මවුපියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි සීල සම්පත්තියෙහි, ත්‍යාග සම්පත්තියෙහි, ප්‍රඥා සම්පත්තියෙහි පිහිටුවා ප්‍රත්‍යුපකාර කළ යුතු ම ය. මව්පියන් ළඟ යම්කිසි අඩුපාඩුවක් වරදක් ඇතිනම් දරුවන් ඒවා ඉවසීමෙන් මව්පියන්ට සත්කාර කළ යුතු ය.

යමකු මව, පියා ධර්මයෙන් පෝෂණය කරයි ද, ආහාරපානාදියෙන් පෝෂණය කරයි ද, ඔවුන් විසින් කළ යුත්තක් පැමිණි කල්හි එය තමාම කර දෙයි ද, අසනීපයක දී බෙහෙතින් උපස්ථාන කරයි ද,

හෙතෙම මෙලොව දී ම සමාජයේ ප්‍රශංසා ලබයි. ගෞරවය ලබයි. මරණින් මතු දෙව්ලොව ඉපිද දිව සැපතින් සතුටු වෙයි.

යමකු මවුපියන්ට උපස්ථාන කිරීමට පුළුවන්කම තිබියදීත් උපස්ථාන නොකර සිටී නම්, එම දරුවන් මෙලොව පරලොව පරිහාණිය වැළඳගත්තෝ වෙති. මවුපියන්ට සැලකීම මංගල කරුණු අතරින් එකක් වන අතර, එය සතර අපායට ගමන් කරන මඟ වළක්වන කරුණක් ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත. හොඳ දරුවකු තැනීම දරුවාටත්, මව්පියන්ටත් සෙසු ලෝකයටත් යහපත පිණිසම පවතින්නේ ය.

දඩල්ල, වාලුකාරාම වෙහෙරවැසි
ශාස්ත්‍රපති
**රත්ගම සුනීත හිමි**

# සඳ ඉල්ලා හඬනවා ද?

**තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වසන කල්හි එක් උපාසකයකු අරභයා මෙම කතා පුවත දේශනා කොට වදාළහ.**

සැවැත්නුවර එක්තරා උපාසකයකුගේ පුතකු හදිසියේ මියගියා. ඔහු පුතාගේ අභාවයෙන් පසුව හඬා වැටෙමින් කාලය ගත කළා. කිසිදු කර්මාන්තයක් නොකර නිවසේ ම කුළෑටිව සිටියා.

ශාස්තෘන් වහන්සේ අලුයම් කාලයේ දී මහා කරුණා සමාපත්තියෙන් නැඟී සිට ලෝකය දෙස බලන්නේ, ඒ උපාසක දැක පෙරවරුවේ පා සිවුරු ගෙන ඔහුගේ ගෙදරට වැඩම කොට දොරකඩ වැඩ සිටියා. උපාසකතුමා උන්වහන්සේ වැඩම වූ බව අසා වහා ගොස් සිවුරු පිළිගෙන ගෞරවයෙන් ආසනයක් පනවා වැඩම වූවා.

බුදුරජාණන් වහන්සේ අහනවා "උපාසකය, ඔබ ශෝකයෙන් පීඩිතව සිටින්නේ ඇයි?"

"ස්වාමීනි, මගේ ප්‍රියමනාප වූ පුතා මියගියා. මම ඒ ශෝකයෙන් පීඩිතව සිටිමි.

උන්වහන්සේ ඔහුගේ දුක දුරු කිරීම පිණිස මෙසේ දේශනා කොට වදාළා.

ඈත අතීතයේ කසීරට බරණැස් නුවර ධර්මපාල නම් බමුණු ගමක් වූවා. එහි බ්‍රාහ්මණයා හා බැමිණිය ද, පුතා දියණිය හා බිරිය ද,දාසියක් ද මරණානුස්සති භාවනාව මනාකොට පුරුදු පුහුණු කරමින් සිටියා.

දිනක් බ්‍රාහ්මණයා පුත්‍රයා සමඟ කුඹුරට ගොස් කුඹුර සී සාද්දී, පුත්‍රයා වියළි තණ කොළ ගිනි දල්වමින් සිටියා. එතැන ගසක සිටි නාගයකු දැවිල්ල නිසා ඇති වූ බියෙන් රුක් සිදුරෙන් එළියට ඇවිත් මේ බ්‍රාහ්මණ පුත්‍රයාට දෂ්ට කළා. ඔහු විෂ වේගයෙන් මුසපත්ව එතැනම මැරී වැටුණා. ඔහු දෙව් පුතකු වී දෙව්ලොව උපන්නා.

බ්‍රාහ්මණයා තම පුතා මළ බැව් දැන කුඹුර අසලින් යන මගියෙකුට කතාකොට "මගේ ගෙදරට ගොස් බිරිඳට කියන්න. හොඳින් දිය නා පිරිසුදු ඇඳුම් ඇඳ එක් අයකුට පමණක් බත් ද, මල්මාලා, සුවඳ ආදිය ගෙන එන්න කියා "පණිවිඩයක් යැව්වා. ඒ පුද්ගලයා බැමිණියට එය දැනුම් දුන්නා.

ගෙදර පවුලේ උදවිය ද එසේ කළා. බ්‍රාහ්මණයා ද දිය නා බත් කා පිරිවර ජනයා සමඟ පුතාගේ මළ සිරුර දර සෑයට නංවා ගිනි දල්වා දර කඩක් දවන්නාක් මෙන් ශෝක නැතිව සන්තාපයක් නැතිව අනිත්‍ය යන හැඟීම මෙනෙහි කරමින් සිටියා.

දෙව්පුත තමා විසින් පෙර ජීවිතයේ දී කළ පින් මොනවා දැයි නුවණින් විමසා බලන විට පියාට ද, නෑයන්ට ද අනුකම්පාවෙන් "බමුණකුගේ ස්වරූපයෙන් තම චිතකය දවන තැනට පැමිණියා. ශෝක නොකරන නෑයන් දැක "පින්වත් ඔබලා මුවෙක් ද දවන්නේ? මම ද ඉතා කුසගින්නේ සිටින්නේ. මට ද මස් ටිකක් දෙන්න." යැයි කියා සිටියා." බමුණ මේ මුවෙක් නොවේ. මනුෂ්‍යයෙක්."

"මේ දවන තැනැත්තා ඔබගේ සතුරෙක් ද?"

"නැත. මේ අපගේ එකම පුතා. ඔහු ඉතා ගුණවත් නැණවත් තරුණයෙක්."

"එබඳු එකම පුතා මියගිය පසු ඔබලා ශෝක නොකිරීමට හේතුව කුමක්ද?

"සර්පයා කරන්නේ තමාගේ හැව දිරලා ගිය විට ඒක ශරීරයෙන් අත් හරින එකයි. අන්න ඒ වගේ මේ ශරීරයත් ප්‍රයෝජනයට ගන්න බැරිවෙන කොට අත්හැරල කළුරිය කරනවා. ගින්නෙන් පිච්චෙන ඒ මළ සිරුරට ඥතීන්ගේ වැළපීම අවබෝධ වෙන්නේ නැහැ. ඒ නිසා මියගිය දරුවා සිහි කරලා මම අඬන්නේ නැහැ. එයාට යන්නට යම් ගමනක් තියෙනවා නම් එයා ඒ ගමන ගියා."

මෙසේ බමුණා විසින් තමන්ගේ සිහි නුවණ, කල්පනා කිරීමේ දක්ෂතාව ප්‍රකාශ කළ විට බමුණා වෙස්ගත් දෙව්පුතු බැමිණිය වෙත ගොස් අසා සිටිනවා.

"මෑණියනි, මේ මළ තැනැත්තා ඔබගේ කවුද?"

"දස මසක් කුසයෙහි හොවා ප්‍රසූත කොට කිරිපොවා අත්පා හදා ලොකු මහත් කළ මගේ පුතා."

"මෑණිවරුන්ගේ හදවත මෘදු ය." උණුවෙන සුලුයි. කවරක් නිසා ඔබ නොහඬා සිටින්නී ද?"

මගේ පුතා පරලොවින් මෙලොවට ආවේ අපි අඬගහල නොවේ. ඔහු මෙලොවින් පරලොව ගියෙත් අපගේ අවසරය අරගෙන නොවෙයි. යම් ආකාරයකින් ආවා ද ඒ ආකාරයෙන් ම ගියා. එසේ නම් වැලපීමේ අරුත කුමක්ද? ගින්නෙන් පිච්චෙන ඒ මළ සිරුරට ඥාතීන්ගේ වැලපීම් අවබෝධ වෙන්නේ නැහැ. එනිසා මියගිය දරුවා සිහිකරලා මම අඬන්නේ නැහැ. එයාට යන්නට නිසි ගමනක් තියෙනවා නම් එයා ඒ ගමන ගියා."

එසේ බැමිණියගේ වචනය අසා ඔහුගේ සහෝදරිය වෙත ගියා.

"නැඟණියනි, මේ මළ තැනැත්තා ඔබගේ කවුද?"

"මේ මගේ එකම සොහොයුරා"

"සහෝදරියෝ තම සොහොයුරා කෙරෙහි ආදරය ඇති අයයි. කවර හේතු නිසා නොහඬන්නී ද?"

"මම අඬන්නට ගියොත් වෙන්නේ කෙට්ටු වෙනවා විතරයි. ඇඬීමෙන් මට ඇති ඵලය මොකක්ද? අපේ නෑදෑ හිතමිතුරන්ටත් වෙන්නේ නො ඇල්ම පමණයි.

ගින්නෙන් පිච්චෙන ඒ මළ ගිය තැනකට ඥාතීන්ගේ වැලපීම අවබෝධ වෙන්නේ නැහැ. ඒ නිසා එම සහෝදරයා සිහි කරල මම අඬන්නේ නැහැ. එයාට යන්නට යම් ගමනක් තිබෙනවා නම් එයා ඒ ගමන ගියා."

ඒ නැඟණියගේ වචන අසා ඔහුගේ භාර්යාවගෙන් මෙසේ විමසුවා.

"මියගිය පුද්ගලයා ඔබගේ කවරෙක්ද?"

ඒ මගේ සැමියා."

"ස්ත්‍රීන් තම ස්වාමියාට ඉතාම සෙනෙහෙවන්තයි. ස්වාමියා මිය ගිය පසු ඕ වැන්දඹු වෙනවා. අනාථ වෙනවා. එසේ තිබියදීත් නො හඬා ඉන්නේ ඇයි?"

"පොඩි දරුවෙක් ඉන්නවා. එයා ආකාසයේ ගමන් කරන සඳ ඉල්ලා අඬනවා. යමෙක් මියගිය උදවිය ගැන හඬනවා නම්, අන්න ඒකත් ඒ වගේ දෙයක් තමා. ගින්නෙන් පිච්චෙන ඒ මළ සිරුරට ඥතීන්ගේ වැලපීම අවබෝධ වන්නේ නැහැ. ඒ නිසා මියගිය සැමියා සිහිකරලා මම අඬන්නේ නැහැ. එයාට යන්නට යම් ගමනක් තියෙනවා නම් එයා ඒ ගමන ගියා."

බිරිඳගේ වචන අසා දාසිය ළඟට ගොස්,

"නැඟණියනි, මේ මිය ගියේ ඔබගේ කවුද?"

මේ මගේ අයිතිකරුයි" (ස්වාමියා)

"එසේ නම් ඔහුගෙන් දැන් ඔබ නිදහස් වරදට දඬුවම් දීමට කෙනෙක් නැහැ."

"එසේ නොකියන්න. මගේ ස්වාමියා ඉවසීමෙන් ද මෛත්‍රීයෙන් ද දයාවෙන් ද යුත් අයෙක්."

"එසේ නම් ඔබ නො හඬන්නේ ඇයි?"

"පින්වත් බ්‍රාහ්මණය, මැටි කළයක් බිඳිලා ගිය විට ආයේ පැරැණි විදිහට ඒක පූට්ටු කරන්න බැහැ. යමෙක් මියගිය උදවිය ගැන හඬනවා නම්, අන්න ඒකත් ඒ වගේ දෙයක් තමා. ගින්නෙන් පිච්චෙන ඒ මළ සිරරට ඥාතීන්ගේ වැළපීම අවබෝධ වෙන්නේ නැහැ. ඒ නිසා මියගිය ස්වාමියා සිහිකර මම අඬන්නේ නැහැ එයාට යන්නට යම් ගමනක් තියෙනවා නම්, එයා ඒ ගමන ගියා.

දෙවුපුතු ඔවුන්ගේ ධර්ම කතා අසා පැහැදී, ඔවුන් මරණානුස්සතිය මැනවින් පුරුදු පුහුණු කර තිබෙනවා. අද පටන් ඔබලා විසින් කෘෂි කර්මාන්තය කළ යුතු නැහැ'යි පවසා ඔවුන්ගේ නිවස සත් රුවනින් පුරවා ප්‍රමාද නොවී දන් දෙමින් සිල් රකින්නැයි අවවාද කොට තමා කවුදැයි හඳුන්වා දී පිටත් වී ගියා.

ශාස්තෘන් වහන්සේ මෙම කතාව ගෙනහැර දක්වමින් උපාසකයාගේ ශෝකය නැමති උල සහමුලින් ම උදුරා දැමුවා. ඒ උපාසකතුමා අවසානයේ දී සෝවාන් ඵලයට පත්වුණා.

**"සර්පයා කරන්නේ තමාගේ හැව දිරලා ගිය විට ඒක ශරීරයෙන් අත් හරින එකයි. අන්න ඒ වගේ මේ ශරීරයත් ප්‍රයෝජනයට ගන්න බැරිවෙන කොට අත්හැරල කළුරිය කරනවා. ගින්නෙන් පිච්චෙන ඒ මළ සිරුරට ඥතීන්ගේ වැළපීම අවබෝධ වෙන්නේ නැහැ. ඒ නිසා මියගිය දරුවා සිහි කරලා මම අඬන්නේ නැහැ. එයාට යන්නට යම් ගමනක් තියෙනවා නම් එයා ඒ ගමන ගියා."**



**පොල්ගහඅංගේ සද්ධාතිස්ස හිමි**

# සැදැහැ සිත ජීවිතයට රැකවරණයකි



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ අමරවංශ හිමි**

**අනුරාධපුර සමයේ බැමිණිතියාසාය කියලා මහා නියං සමයක් ආවා. ගස් වැල් විනාශ වුණා. ඇළ දොළ, ගංගා හිඳිලා ගියා. කෑම බීම නැති නිසා මිනිසුන් ඒ ඒ තැන වැටිලා මිය යන්න පටන් ගත්තා. මිල මුදල් තිබුණ පොහොසත් අය විදේශ රටවලට පැන ගියා. දුර්භික්ෂය පුරා වසර දොළහක් පැවතුණා. ජීවිතය රැක ගන්න මිනිසුන් කැලෑවලට වැදුණා. කොළ සහිතව ගස් වැල් මිනිසුන් අයිති කර ගත්තා.**

කොළ, මුල්, දළු, පොතු ආදිය තම්බා ආහාර වේල සපයා ගත්තා. එක් අඹුසැමි යුවළක් ගම අතහැර සෙසු ජනතාව වගේම ජීවිතය රැක ගන්න කැලෑවකට පිටත් වුණා. ඔවුන් දැක්කා හොඳින් කොළ වැඩී තිබෙන කරකොළ ගහක්. අතු තුනක් මේ ගහේ තිබුණා. දෙන්නා කතා කරගත්තා එක අත්තක කොළවලින් කුසගින්නෙන් තමන් වෙතට එන ආගන්තුකයන්ට සත්කාර කරන්න. තවත් අත්තක් වෙන් කර ගත්තා දානයක් දෙන්න.

තුන්වැනි අත්තේ හටගන්නා කොළ දෙදෙනාගේ ආහාරයට වෙන් කර ගත්තා. ගහ සමීපයේ කුඩා පැලක් හදාගෙන කරකොළ කමින් මේ දෙන්නා දැන් ජීවත් වෙනවා. ආගන්තුක කෙනෙක් ආවොත් වෙන් කළ අත්තේ කරකොළවලින් ඔවුන්ට සත්කාර කළා.

කොපමණ කුසගිනි දැනුණත් තමන් වෙනුවෙන් වෙන් කර ගත් අත්තේ කොළ ඇර සෙසු අතුවල කොළ කැඩුවේ නෑ. මිනිසුන් ආහාර හිඟයෙන් පීඩා වින්ද නිසා මේ කාලයේ භික්ෂූන් වහන්සේට පිණ්ඩපාතය ලැබුණේ නෑ. සමහර භික්ෂූන් වහන්සේලා වෙනත් රටවලට වැඩම කළා. එහෙත් තවත් පිරිසක් දුක සේ ජීවත් වුණා. දවසක් භික්ෂූන් වහන්සේ නමක් පිණ්ඩපාතයක් ලැබේවි යැයි හිතා පාත්‍රය ගෙන පිණ්ඩපාත චාරිකාවේ යෙදුණා. මිනිසුන් ජීවත් වූ ස්ථාන කරා පිණ්ඩපාතයේ ගියත් කිසිම දෙයක් ලැබුණේ නෑ.

කුසගින්න ඉවසාගත නො හැකිව සිටි තෙරුන් වහන්සේ ඈතින් තිබුණු පර්වතය සමීපයේ ගෙයක දුම් සංඥාවක් දැක්කා. උන්වහන්සේ එතැනට වැඩම කළා. ඒ පැලේ හිටියේ අර සැදැහැති අඹුසැමි යුවළ. තෙරුන් වහන්සේට වන්දනා කර පාත්‍රය අතට අරගෙන

'ස්වාමීනි, ටික වේලාවක් වැඩ ඉන්න, ඔබ වහන්සේට අපි දානය සකසා පූජා කරන්නම්'යැයි ආරාධනා කර ස්වාමිපුරුෂයා බිරිඳ අමතලා

'සොඳුරිය, අප දෙදෙනා බොහෝ දවසක් බලා සිටිය අදහස අද ඉටු වුණා. අපට හිමි කරකොළ ගහේ දානයක් වෙනුවෙන් වෙන් කළ කොටස තවමත් පූජා කර ගන්න බැරි වුණා. අද එය ඉටුවුණා'යි

බොහෝම සතුටට පත් වෙලා ස්වාමියා ගියා කරකොළ ගහේ කොළ ටික ගෙන එන්න. ටික වේලාවකින් හිස් අතින් ම එන සැමියා දැක බිරිඳ බොහෝ දුකට පත් වුණා. ගෙදරට ගොඩ වෙන්නත් පෙරාතුව පෙර මඟට දුවගෙන ගියා.

'ඇයි? ස්වාමිනි, හිස් අතින් ගිය පමාවටත් පෙරාතුව නැවත ආවේ?'යි ප්‍රශ්න කළා.

'සොඳුරිය, පින් තියන අය හිතන දේ, ප්‍රාර්ථනා කරන දේ ඉක්මනින් ම ඉටුවෙනවා. අප දෙදෙනා දුප්පත් වෙලා ඉපදුණේ පෙර පින් මදි නිසා. බොහෝ කාලයක් අප බලා හිටියා දානයක් පූජා කරන්න. අද ඒ භාග්‍ය උදා වුණා. ඒත් කරකොළ ගහේ එක කොළ යක්වත්, දල්ලක්වත් නෑ. ඊයේ රෑ පණුවෝ ඒ ඔක්කොම කා දමලා. අප දැන් මොනවාද කරන්නේ. තෙරුන් වහන්සේට ආරාධනා කර කිසිවක් පූජා නොකර ආපසු වැඩම කරවන්න බෑ.'යි දැන්වූවා. බිරිඳ ඒ සියල්ල අහගෙන ඉඳලා දුක්ට පත් වුණා.

වහාම ගෙට දුවගෙන ගියා. උයන තැන තිබුණු තියුණු පිහිය අරගෙන නිවසේ පිටුපසට දිව්වා. සැමියාත් වහා ගෙට දුවගෙන ගිහින් තවත් පිහියක් අරගෙන නිවසේ පිටුපසට ගියා. බිරිඳ වේලාසනින් එතැනට ආපු බවවත් ඔහු දන්නේ නෑ. ඔහුගේ සිතෙත්, ඇයගේ සිතේත් තිබුණේ දානය කෙසේ හෝ දෙන්න ඕන කියන අදහස. දෙදෙනාම කුමක් කරනවා දැයි කතිකා කර ගත්තේවත් නෑ. ගෙයි පිටුපස පිහියක් අතැතිව සිටින බිරිඳ ව දැකපු සැමියා

'ඇයි මේ පිහියක් අරගෙන මෙතැන? දැන් මේ කුමක් කරන්නද හදන්නේ?'යි විමසුවා.

'ස්වාමිනි, අද කෙසේ හෝ සංඝයා වහන්සේ වෙනුවෙන් දානයක් දෙමු. පෙර පින්මද නිසායි අප මෙහෙම දුප්පත් වුණේ. මම මගේ කලවා මාංසය කපා නො දන්වා ම එය උයා තෙරුන් වහන්සේට දානය දෙනවා'යි පවසා සිටියා.

එවිට සැමියාත් මෙහෙම කියන්න පටන් ගත්තා. 'මමත් මේ පිහිය අරගෙන ආවේ ඔය අදහසින් ම තමයි. ඔබ එයට බාධා කරාවි යැයි මම කියා සිටියේ නෑ. දැන් දෙදෙනාම එකම සිතිවිල්ල ඇතිව දානය දෙන්න සූදානම් වුණා.

ස්ත්‍රීන්ට දුක් උහුලන්න බෑ. ඒ නිසා මම මගේ කලවා මාංශයක් කපා දෙන්නම්. ඔබ එය උයා තෙරුන් වහන්සේට පූජා කරන්න'යි කියා තියුණු පිහිය අතට ගෙන කලවා පෙදෙසෙන් කොටසක් කපන්න සූදානම් වුණා. ඒත් සමගම ගෙයි ඉදිරිපසින් කවුදෝ මහත් හඬින් නිවැසියන්ට අඬගසන ශබ්දයක් ඇහෙන්න පටන් ගත්තා.

දෙදෙනාම දුවගෙන ගියා නිවස ඉදිරියට. දුප්පත්, මහල්ලෙක් බඩුමල්ලකුත් අරගෙන ගේ ඉදිරියේ ඉඳගෙන ඉන්නවා දැක්කා. ඔහු තරුණ යුවළ අමතලා

'පින්වත් දරුවනි, මම ඈත ගමක සිට මේ එන්නේ. දවස් ගණනක් ඇවිද ආ නිසා බොහොම වෙහෙසයි. මගේ ළඟ උයන පිහින බඩු ටිකක් තියනවා. මට ඒකෙන් කෑම ටිකක් හදා දෙන්න පුළුවන්ද?'යි විමසා සිටියා.

සැදැහැති අඹුසැමි දෙදෙනා සතුටින් එය බාර ගත්තා. එවිට මහල්ලා මෙහෙම කියනවා

'පින්වත් දරුවනි, මේ ද්‍රව්‍යවලින් ආහාර පිස තෙරුන් වහන්සේට පූජා කරන්න. මම මේ සමීපයට ගිහින් එන්න යනවා. මම එන්න ප්‍රමාද වුණොත් ඔබලාත් අනුභව කරන්න. මම එනතෙක් බලා ඉන්න එපා'යි පවසා ඔහු යන්න ගියා.

මෙහෙම මහල්ලෙක් ලෙස පැමිණ තිබුණේ ශක්‍ර දේවේන්ද්‍රයෝ යි. අඹුසැමියන් තමන්ගේ කලවාවල මාංශ කපා උයලා තෙරුන් වහන්සේට වළඳවන්නට සැරසෙන විට ශක්‍ර දෙවියන්ගේ පණ්ඩුකම්බල ශෛලාසනය උණුවෙන්න පටන් ගත්තා. ඔවුන්ගේ ශ්‍රද්ධා සිත එතරම් ම බලවත් වුණා. කෙසේ හෝ වහාම පිහිට විය යුතු යැයි හිතා ඇල්හාල් පිරවූ නැළියකුත්, දීකිරි කළයකුත්, තෙල් කළයකුත්, මුව මස් ගාතයකුත් එදා අරගෙන ගොස් තිබුණා.

දෙදෙනා සතුටින් ආහාර පිළියෙළ කර තෙරුන් වහන්සේට දානය පූජා කළා. මහලු තැනැත්තා එන තෙක් දෙදෙනා බොහෝ වේලාවක් බලන් හිටියා. ඒත් පැමිණියේ නෑ. දෙදෙනාත් ආහාර ගත්තා. සවස් සමයේ ආහාර පිසූ වළං නැවත විවෘත කර බලන විට හැම වළඳකම දකින්න ලැබුණේ පළමුවෙන් හැන්ද ගැසූ තැන හිස් අවකාශය පමණයි. පිසූ ආහාර කොපමණ බෙදා ගත්තත් අඩු වුණේ නෑ. එදින පටන් සැදැහැති මේ දෙන්නා තෙරුන් වහන්සේට සිත් සේ දන් දෙන්න පටන් ගත්තා. නොයෙක් දුගී මගී යාචකාදීන්ට දන් දුන්නා. සිල් රකිමින් බොහෝ කලක් ජීවත් වී ආයුෂ කෙළවර දෙව්ලොව උපත ලැබුවා. දෙදෙනාගේ ශ්‍රද්ධා මහිමය නිසා දුප්පත් දිවි පෙවත අවසන් වුණා. පරලොවට බොහෝ පින්දහම් කර ගත්තා.

දිව්‍ය සැප සම්පත් ලැබුවා. මේ සියලු සැප සම්පත් දෙදෙනාට හිමි වුණේ පිරිසුදු ආධ්‍යාත්මික දාන සිතිවිලි නිසා. දන්දීමට අවස්ථාවක් පැමිණෙනකම් හෝ වස්තු සම්පත් ලැබෙනකම් හෝ බලා සිටීමට වඩා සැදැහැසිතින් තමන් සතු කිසියම් හෝ දෙයක් දන්දීමට සිත පහදිනවා නම් එයම මහත්ඵල මහානිසංස ගෙන දෙන පින්කමක් වන බව මේ කතා පුවත අපට පෙන්වා දෙනවා.



# නිර්මල බුදු දහමේ හරය ජාත්‍යන්තරයට ගෙන ගියා



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ**

**මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි විහාර පාර්ශ්වයේ සයිප්‍රසයේ ප්‍රධාන සංඝ නායක සයිප්‍රස් ශ්‍රී ලංකාරාමය හා කැලණිය වේවැල්දූව ශ්‍රී නාගරුක්ඛාරාම පුරාණ විහාරය යන උභය විහාරාධිපති කාව්‍ය විභූෂණ ධර්ම කීර්ති ශ්‍රී**

## පූජ්‍ය මොරවක සෝරත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය

**පාරිවේණික අධ්‍යාපනය නිමාකරමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා ශික්ෂාකාමී බහුශ්‍රැත භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් ක්‍රියා කිරීමට පසුබිම සකස් වුණ ආකාරය පැහැදිලි කරන්න අපේ හාමුදුරුවනේ,**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරලයට අයිති මොරවක කොස්ටිල්ගොඩ නමින් හඳුන්වන බොහොම සුන්දර ග්‍රාමීය පරිසරයක ජන්මෝත්පත්තිය ලැබීමට තරම් මම වාසනාවන්ත වුණා. ආගමට, දහමට ළැදිව, තුනුරුවන් කෙරෙහි බොහොම ගෞරවයෙන්, ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීමේ සංසාර පුරුද්ද පුංචි කාලයේ සිටම මා තුළ පැවතුණ ගුණාංගයක්.

ඒ වගේම සෑම පොහොය දිනකට ම අත්තම්මත් සමඟ සිල් සමාදන් වුණා. සසරේ පුරණ පාරමිතා බලය නිසා වෙන්නැති පුංචි කාලයේ සිටම පැවිදි වීමට ලොකු ආසාවක් තිබුණා. පාසලේ විදුහල්පති හාමුදුරුවන්ගේ මඟ පෙන්වීමත්, පැවිදි වන ලෙස උන්වහන්සේ කළ ඉල්ලීමත් නිසා ආදරණීය දෙමව්පියන්ගේ ආශිර්වාදය ඇතිව ගණේගොඩ පුරාණ විහාරස්ථානයට යාමට අවස්ථාව උදා වුණා.

අනතුරුව නායක හාමුදුරුවන් වහන්සේගේ සෙවණේ රැකවරණය ලබමින් උතුම් පැවිදි දිවියකට ඇවැසි මූලික බණ දහම් වත් පිළිවෙත් ඉතාම හොඳින් පුරුදු වුණා. සැදැහැති මව්පියන්ගෙන් ලැබුණු ශාසනික උරුමයත්, සංසාරයේ පුරණ පාරමිතා බලයත්, පූර්වෝකෘත පුණ්‍ය මහිමයත් අනුව 1981 වර්ෂයේ දී මොරවක සෝරත යන ශාසනික නාමයෙන් උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ උත්තරීතර ප්‍රව්‍රජ්‍යාභාවය ලැබීමේ පින්බර මොහොත උදාවුණා.

අනතුරුව පුංචි සාමණේර ස්වාමින් වහන්සේ නමක් වශයෙන් වසර 2ක් පුරා ආචාර්යපාදෝත්තමයාණන් වහන්සේ සෙවණේ බණ දහම් වත්පිළිවෙත් පූරණය කළා.

පන්සල් සංස්කෘතියේ එහෙම අධ්‍යාපන ක්‍රමයක් තිබෙනවා. පසුව ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගැනීම සඳහා 1983 වර්ෂයේ දී ගාල්ල ශ්‍රී රේවත විද්‍යායතන පිරිවෙනට ඇතුළත් වුණා. පරිවේණාධිපති ගෞරවණීය අහංගම මංගල නායක හාමුදුරුවන් වහන්සේ ඇතුළු සුපේශල ශික්ෂාකාමී ශාස්ත්‍රඥයන් වහන්සේලා යටතේ ශාස්ත්‍රෝන්නතිකාමීත්වයෙන් යුතුව සාර්ථක භික්ෂු අධ්‍යාපනයක් ලබාගෙන 1987 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගත්තා. ඒත් 1988,1989 වර්ෂවල රටේ පැවැති කලබලකාරී වාතාවරණය නිසා 1990 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙලා ශාස්ත්‍රවේදී උපාධිය ලබා ගත්තා.

ඒ වගේම මාගේ පැවිදි පින්කමේදීත්, උපසම්පදා පුණ්‍යෝත්සවයේදීත් ආචාර්ය උපාධ්‍යායන් වහන්සේ වශයෙන් කටයුතු කළ පූජ්‍ය දෙල්ලව සුසීල නායක හිමිපාණන් වහන්සේ, සාහිත්‍යසූරි නිවන්දම ශ්‍රී ධර්මකීර්ති නායක හිමිපාණන් වහන්සේ, පුණ්‍යානුමෝදනා පූර්වකව ගෞරවයෙන් මේ අවස්ථාවේදී සිහිපත් කළ යුතුයි. ඒ නිවැරැදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කළ සුපේශල ශික්ෂාකාමී අර්ථචර්යාවෙහි පිළිපත් සංඝසෝභන ගුණාංගයන්ගෙන් සම්භාවනාවට පාත්‍ර වූ සංඝ නේතෘන් වහන්සේලාගේ සෙවණේ කටයුතු කිරීම නිසාම භික්ෂු ආකල්පයන්ගෙන් සෝභමාන භික්ෂු ජීවිතයක් ගොඩනැඟීමේ මූලික පසුබිම සකස් වුණා.

**සයිප්‍රසයේ ප්‍රධාන සංඝනායක ධුරය හොබවමින් දෙස් විදෙස් කීර්තිධර ස්වාමීන් වහන්සේ නමක් ලෙස වැඩ සිටින ඔබ වහන්සේ ජාතික, ආගමික, ශාසනික, ධර්ම දූතමය වශයෙන් සිදුකරන සේවය මොන වගේද, නායක හාමුදුරුවනේ.**

මම පුංචි කාලයේ සිටම කලාවට තිබුණ ළැදියාව පැවිදි බිමට පත් වුණාට පසුවත් එලෙසම පැවතුණා, එනිසාම කාව්‍යමය ධර්ම දේශකයන් වහන්සේ නමක් හැටියට මා රට පුරාම ප්‍රසිද්ධ වුණේ. ඒ කාල පරිච්ඡේදයේ දී ම ධර්මදූත ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ආසියාතික රටවල් ගණනාවකටත් වැඩම කළා.




යුරෝපයේ වැඩ සිටින වල්පොළ කල්‍යාණතිස්ස නායක හාමුදුරුවන්ගේ ආරාධනාව අනුව මම ස්විට්සර්ලන්තයට වැඩම කරමින් උන්වහන්සේගේ ආශිර්වාදය මත බොහෝ කාලයක් එම විහාරස්ථානවල ආගමික කටයුතු සිදු කළා. ඒ කාල පරිච්ඡේදයේ දී ම ලැබුණු ආරාධනාවකට අනුව සයිප්‍රසයට වැඩම කිරීමට සිදු වුණා. ශ්‍රී ලාංකිකයන් 18000ක් පමණ සයිප්‍රස්වල සේවය කරනවා. ඔවුන්ගේ ආගමික කටයුතු සිදු කරන ගමන් නිර්මල ථෙරවාදී බුදුදහම ජාත්‍යන්තර ජනතාව වෙත සමීප කරවීමට කටයුතු කළා.

ඒ වගේම මගේ අනුශාසකත්වයෙන් ශ්‍රී ලාංකිකයන් එක්ව ශ්‍රී ලංකා බෞද්ධ සංගමයක් පිහිටුවා ගනු ලැබුවා.

එම ශ්‍රී ලංකා බෞද්ධ සංගමය විසින් ශ්‍රී ලංකාරාමය නමින් විහාරස්ථානයක් ආරම්භ කරමින් මා වෙත භාරදීමට කටයුතු කළා. සෑම පොහොය දිනකම සීල භාවනා වැඩසටහන් පවත්වනු ලබනවා. සෑම ඉරුදිනකම පවත්වනු ලබන ධර්ම සාකච්ඡා, ධර්ම දේශනා සඳහා දහස් සංඛ්‍යාත පිරිසක් සහභාගි වෙනවා. ඒ වගේම මානසික පීඩනය දුරුකරලීමට ලබා දෙන උපදේශන සේවයට ඉහළ වටිනාකමක් ලැබිල තිබෙනවා.

වෙසක් පොහොය පින්කම්, කඨින පින්කම් ඉතාම හොඳින් සිදුකරන ගමන් ලංකාවට වැදගත් වන විශේෂිත දින මාතෘභූමියේ ගුණ සුවඳ ඔවුන්ට දැනෙන ආකාරයට සමරනු ලබනවා.

මහගෙදර තිබුණ අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඇතුළත්ව උඩරට, පහතරට, නර්තන සම්ප්‍රදායන්, රබන් සුරල්, ඔන්චිලි වාරම් සමඟ අංග සම්පූර්ණ අවුරුදු ගම්මානයක් පන්සල මූලික කරගෙන පවත්වනු ලබනවා. ඒ වගේම යටත් විජිත යුගයේ නිදහස් අරගල කළ මිනිසුන්ගේ ගුණ සුවඳ නූතන තරුණ පරපුරට දැනෙන ආකාරයට නිදහස් දිනය සමරනු ලබනවා.

ධර්මදූත ස්වාමින් වහන්සේ නමක් වශයෙන් නිර්මල බුදු දහමේ හරය යුරෝපීය ජන ජීවිතයට මුසු කරන ගමන් අපේ සංස්කෘතික හරපද්ධතීන් ආරක්ෂා කරමින් එම සංස්කෘතික වටිනාකම ඔවුන් වෙත ඥානණය වීමට අවස්ථාව ලබා දෙනවා.

ඒ වගේම කැලණිය වේවැල්දූව ශ්‍රී නාගරුක්ඛාරාම විහාරස්ථානය සියලු විහාරාරාංගයන්ගෙන් සමලංකෘත දර්ශනීය විහාරස්ථානයක් බවට පත්කරමින් ප්‍රදේශයේ ජනතාවගේ දෙලොව යහපත අභිවෘද්ධිය පිණිස කටයුතු කරනවා.

ජාතික සහ ජාත්‍යන්තරව සිදු කරන ජාතික, ආගමික, ශාසනික සේවය ඇගයීමට ලක් කළ මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහා නායක මා හිමිපාණන් වහන්සේ ප්‍රමුඛ ගරුතර මහා සංඝරත්නය සයිප්‍රසයේ ප්‍රධාන සංඝ නායක ධුරයෙන් පිදුම් ලැබීමට කටයුතු කළ බවත් ගෞරව පූර්වකව සිහිපත් කළ යුතුයි.

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් අධ්‍යාපනික හා සමාජීය ප්‍රශ්න හමුවේ නිවැරැදි නායකත්වයක් සැපයූ ඔබවහන්සේ නූතන සරසවි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ක්‍රියාකාරකම් පිළිබඳ දරන මතවාදය සඳහන් කරමින් අපේ සාකච්ඡාව අවසන් කරමු නායක හාමුදුරුවනේ,**

විද්‍යාලංකාර පිරිවෙනින් ආරම්භ කළ විශ්වවිද්‍යාලයක් හැටියට භික්ෂූන් වහන්සේලාගේ සංවිධාන ව්‍යුහයක් අවශ්‍ය කළ නිසා සියලු දෙනාගේම යහපත උදෙසා ශිෂ්‍ය සංගමයක් ආරම්භ කළා. වසර 2ක් සභාපති වශයෙන් කටයුතු කළා වගේම සියලු දෙනාගේම කැමැත්තෙන් මහා ශිෂ්‍ය සංගමයේ සභාපති බවටත් පත්වුණා. එහිදී භික්ෂුත්වයේ ගෞරව ආරක්ෂා කර ගෙන නිවැරැදි නායකත්වයක් ලබා දෙමින් ශිෂ්‍ය ප්‍රජාවගේ සාධාරණ අයිතීන් දිනා දීමට යහපත් ලෙස කටයුතු කළා.

ශිෂ්‍යත්ව අහිමි වූවන්ට ශිෂ්‍යත්වය ලබා දීමට කටයුතු කළා. කවි සංසදයක් ආරම්භ කළා වගේම කලා උළෙල පැවැත්වූවා. සිංහල සංගමය බිහිවුණා. සෑම අධ්‍යයන අංශයක ම සඟරා බිහිවුණා. ශිෂ්‍ය සංගමේ සභාපති වශයෙන් "චින්තක" සඟරාව නැවත ආරම්භ කළා. භික්ෂුත්වයේ ගෞරවය ආරක්ෂා කරගෙන සියලු දෙනාගේ ම යහපත වෙනුවෙන් ලබා දුන් ආදර්ශවත් නායකත්වය වෙනුවෙන් විශ්වවිද්‍යාල පරිපාලනය, අධ්‍යයන, අනධ්‍යයන, කර්යමණ්ඩලය වගේම ශිෂ්‍ය ප්‍රජාව ඒකරාශීව මම වෙනුවෙන් උපහාර උළෙලක් පැවැත් වූවා. ශිෂ්‍යයෙක් ලෙස උපහාර ලබන්න ඇත්තේ මම විතරක් වෙන්නැති කියලත් මට හිතෙනවා. අපි ආදර්ශවත් නායකත්වයක් ලබා දුන්න නිසා අදටත් අපට සතුටු වෙන්න පුළුවන්.

ඉතින් අපි කුමන ස්ථානයක හිටියත් භික්ෂුවක් කියන අවබෝධය අප තුළ තිබෙන්න ඕනේ. අපි විශාල සංඝ සංස්ථාවක් නියෝජනය කරන නිසා, පුද්ගලික චරිතයක් ලෙස හැසිරෙන්න අයිතියක් නැහැ. ජාතියේ මුරදේවතාවුන් වහන්සේ ලෙස හාමුදුරුවරු හඳුන්වනු ලැබුවේත් හැම අභියෝගක දී ම ජාතියට, දේශයට, පුරෝගාමීව රටේ නිදහස වෙනුවෙන් නායකත්වය සැපයූ නිසයි. ඒක අවශ්‍ය වුණත්, ඒ කාරණයට යොමු වීමේ දී බෞද්ධ භික්ෂුවක් ලෙස අපට භික්ෂුත්වය අමතක කරන්න බැහැ. භික්ෂුත්වය අමතක කරල සාමාන්‍ය ශිෂ්‍ය ප්‍රජාව ලෙස කටයුතු කරන්න ගියොත් සිවුරටත් මුළු සංඝ සංස්ථාවටත්, අගෞරවයක් ඇති වන නිසා අපි දිනා ගන්නා ප්‍රතිලාභයට වඩා අපිට අහිමිවන දෙය විශාලයි. සිදුවන හානිය බරපතළයි.බුදුහාමුදුරුවන්ගේ ශ්‍රාවකයන් වහන්සේලා දර්ශන මාත්‍රයෙන් ම නොපහන් සිත් පහන්වන ආකාරයටත් පහන් වූ සිත් සුපහන් වන ආකාරයටත් කටයුතු කිරීම වැදගත්.

හේමමාලා රන්දුනු

# දිනුම පැරදුම තමන් අත ම ය



**ලෝක සත්ත්වයා අනුපමේය මෛත්‍රී කරුණා ජලයෙන් සුවපත් කළා වූ සුවහසක් ලොව දනන් හට ශක්තියක් වූ තුන් ලෝකාග්‍ර වූ අසම සම වූ බුදුරජාණන් වහන්සේ නමක උදෙසා පුද පූජා පවත්වමින් උපහාර දැක්වීමට සාමාන්‍ය මිනිසකු තුළ දැඩි ශ්‍රද්ධාවක් පහළ වූයේ නම්, හෙතෙමේ මහා පුණ්‍යවන්තයෙකි.**

ඒ පිළිබඳ කතාන්තරයක් ධර්මයෙහි සඳහන් වන්නේ මෙසේ ය.

මේ මහා භද්‍ර කල්පයට පෙරාතු ව “පදුමුත්තර” නම් බුදුරජාණන් වහන්සේ සමයෙහි “හංසවතී” නුවර එක් දුගී පවුලක පිරිමි දරුවෙක් උපන්නා. නමින් ඔහු සෝනකයි. අගහිඟකම් මැද ජීවත් වූ අසරණ පවුලක් නිසා නිසි වයසට පැමිණිය ද සෝනක දරුවාට ප්‍රමාණවත් අධ්‍යාපනයක් ලබා දීමට ඔහුගේ මවුපියන්ට නොහැකි වුණා.

එදවස පදුමුත්තර බුදුරජාණන් වහන්සේ වැඳ පුදාගෙන බණ ඇසීමට උන්වහන්සේ වැඩ විසූ විහාරය වෙත දිනපතා බොහෝ පිරිස් ගියා. ඒ බව නිතර දෙවේලේ දුටු සෝනක තරුණයා ද බුදුන් දැක බණ අසන්නට එම පිරිස් හා එක් වුණා.

ඔහු අනෙකුත් සැදැහැවතුන් මෙන් විහාරස්ථානය අතුපතු ගා පිරිසුදු කරමින් මල් පහන් පුදමින් බුදුන් වැඳ බණ ඇසුවා. තෙරුවන් සරණ ගිය ඔහු පංචශීලය රක්ෂා කළ උපාසකයකු බවට පත් වුණා.

මහා පරිමාණයෙන් දන් නොදුන්න ද විහාරස්ථානයෙහි කුදු මහත් කටයුතුවල දී ශ්‍රම දායකත්වයෙන් සිය යුතුකම් ඉටු කළා. වත් පිළිවෙත් රකිමින් නිරන්තරයෙන් විහාරයට ගොස් පින්කම්වලට සහභාගි වුණා. මෙලෙස බුදුන් වඳින්නට ගිය සෝනක තරුණයා ගැන කා තුළත් පැහැදීමක් ඇති වුණා.

පදුමුත්තර බුදුරජාණන් වහන්සේ දෙවි මිනිසුන් සහිත ලෝක සත්ත්වයා කෙරෙහි අනුකම්පාවෙන් සද්ධර්මය දේශනා කරමින් වැඩ හිඳ අවසානයේ සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බව ප්‍රත්‍යක්ෂ කරමින් පිරිනිවන් පා වදාළ සේක.

ආදාහනයෙන් පසු ශේෂ වූ ශාරීරික ධාතූන් වහන්සේ ඒකරාශි කොට සත් යොදුන් උස මහා චෛත්‍යයක් ඉදිකරවා එහි ධාතූන් වහන්සේ තැන්පත් කළා. එසේ තැන්පත් කොට පදුමුත්තර සර්වඥ ධාතුන් නිදන් කරන ලද මහා චෛත්‍ය රාජයාණන්ට පුද පූජා පැවැත්වූ දහස් ගණන් සැදැහැවත් පින්වතුන් අතර සෝනක තරුණයා ද වුණා.

මල් මාලා, මල් වැල්, ධජ පතාකාදියෙන් චෛත්‍යය සරසමින් ගෞරව උපහාර දැක් වූ මහා ජන සමූහයා මෙන් නොව, සෝනක තරුණයාගේ පූජාව වෙනස් මඟක් ගත්තා.

දුගී දුප්පතකු වූ සෝනකට තමා සන්තකව තිබුණේ එක ම උතුරු සළුවක් පමණයි. එය මැනැවින් සෝදා පිරිසුදු කොට විසි රියන් පමණ වූ උණ ගසෙහි අග කෙළෙවරෙහි කොඩියක් මෙන් ගැට ගසා චෛත්‍යය වටා ඔසවාගෙන යමින් සාධු හඬ නඟමින් පිරිනිවන් පා වදාළ පදුමුත්තර බුදුරජාණන් වහන්සේට අපරිමිත වූ ශ්‍රද්ධාවෙන් ඔහු ධජ පූජාවක් කළා. සෝනක තරුණයාගේ තරමට එය අති විශිෂ්ට වූ මහානිසංස වූ උතුම් බුද්ධ පූජාවක්.

සෝනක දුගී තරුණයාගේ අසහාය වූ බුද්ධ පූජෝපහාරය චෛත්‍යය ආරක්ෂාවට පැමිණ සිටි යක්ෂ සේනාධිපතියන් අතරින් නායක “අභිසම්මතක” නම් යක්ෂ සේනාධිපති දැක සෝනක තරුණයා කෙරෙහි අතිශයින් ම පැහැදී ඔහු ගැන මහත් අනුකම්පාව ඇති ව,

“මෙම සෝනක තරුණයා එසේ මෙසේ පුණ්‍යවන්තයකු නොවේ. පිනට දහමට ලැදි මොහු බෙහෙවින් ශ්‍රද්ධාවන්ත ය. දුගී දුප්පත්කමින් මිරිකී ගිය ඔහු සතු එක ම වස්තුව මෙම උතුරු සළුව පමණෙකි.

එය මැනැවින් සෝදා පිරිසුදු කොට කොඩියක් සේ උණ ගසෙක මුදුන් කෙළවර ගැට ගසා ඔසවා ගෙන චෛත්‍යය වටා ප්‍රදක්ෂිණා කරමින් සර්වඥ ධාතූන් වහන්සේ වෙත දක්වන මෙම උපහාරය සුළුපටු නොවූ පින්කමෙක්. මතු ආත්ම භාවයන්ට රැස්කර ගන්නා මහත් වූ කුසල ශක්තියක්. එසේ හෙයින් ම විසින් ද මොහුට යම් උපකාරයක් කළ යුතු”යි සිතුවා.

ඉන්පසු කොඩියක් මෙන් උණ ගසේ මුදුන් කෙළවර ගැට ගසා චෛත්‍යය වටා ඔසවා ගෙන ගිය උතුරු සළුව යක්ෂ සේනාධිපති විසින් තමා අතට  ගෙන අන්‍යයන්ට නොපෙනෙන සේ කොඩිය පමණක් ප්‍රදර්ශනය වන අයුරින් චෛත්‍යය වටා අහසින් යමින් එය ප්‍රදර්ශනය කළා.

ආශ්චර්යවත් මේ සිද්ධිය දැකීමෙන් විස්මයට පත් වන්දනාකරුවන් මහත් සේ හඬ නඟා සාධුකාර පැවැත්වූවා. එයින් වඩාත් ප්‍රමෝදයට පත්ව, ධෛර්යවත් වූ සෝනක වඩ වඩාත් පින්කම්වල යෙදෙමින් කටයුතු කළා. මෙලෙස කාලය ගෙවී යත් ම වියපත් ව මිය ගොස් දෙව් ලොව දිව්‍ය පුත්‍රයකු ලෙස පහළ වුණා.

එතැන් පටන් මහා කල්ප ලක්ෂයක් පුරා දිව්‍ය ලෝක මනුෂ්‍ය ලෝකවල උපත ලබමින් අප්‍රමාණ වූ දිව්‍ය සැප, මනුෂ්‍ය සැප අනුභව කරමින් අවසානයේ මේ මහා භද්‍ර කල්පයෙහි අපගේ ශාන්ති නායක වූ ගෞතම බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ වසන සමයේ සැවැත්නුවර වංශවත් බ්‍රාහ්මණ පවුලක උපත ලැබුවා. මෙසේ උපත ලද පින්වත් බ්‍රාහ්මණ කුමරු “උපවාන” නම් වුණා.

උපවාන කුමරු විසි වයස් පැමිණ කල්හි දක්ෂ ලෙස ශිල්ප ශාස්ත්‍ර ප්‍රගුණ කර තරුණ විය එළැඹෙත් ම ඉගෙනීමේ කටයුතු නිම කර සිටියා.

මෙම අවස්ථාව වන විට අනාථපිණ්ඩික මහා සිටාණෝ අප බුදුපියාණන් උදෙසා ජේතවන විහාරය ඉදිකිරීමේ පින්කමෙහි නිරතව සිටියා. නිරන්තරයෙන් පිනට දහමට සිත් ඇලී සිටි උපවාන බමුණු තරුණයා ජේතවන මහා විහාරය බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ වෙත පූජා කිරීමේ අති උතුම් පුණ්‍ය කර්මයට ද සහභාගි වෙමින් ඒ සඳහා දායකත්වය සපයමින් කුසල් සම්භාරයක් රැස්කර ගනිමින් අතිශය සතුටට පැමිණ ජේතවන මහා විහාරය බුදුරදුන් වෙත පූජා කිරීමෙන් අනතුරුව උන්වහන්සේ එහි වැඩ වාසයට පැමිණීම නිසා සැවැත්නුවරවාසීන්ට පින්දහම් හි යෙදීමට හොඳ ම අවස්ථාව උදා වුණා.

මේ නිසා බුදුරජාණන් වහන්සේ වැඳ බණ ඇසීමට යන පිරිස දිනෙන් දින දස දහස් ගණනින් වැඩි වුණා.

උපවාන තරුණයා ද දිනපතා බණ අසන්නට ජේතවනාරාමයට ගිය නිසා ඔහු තුළ පැවැති ශ්‍රද්ධාව වඩ වඩාත් දියුණු වුණා. එමෙන් ම බණ ඇසීමෙන් ජීවිතය පිළිබඳ යථාවබෝධයක් ලැබුණා.

ජීවිතයෙහි නිස්සාර බව දුටු හෙතෙම කළකිරීමට පත්ව තෙරක් පරතෙරක් නැති කම්කටොලුවලින් ගහන ගිහි ජීවිතයෙහි කටුක දුක යැයි සිතා කළකිරීමට පත් පැවිදිවන්නට සිතුවා.

නොබෝ කලෙකින් බුදුරජාණන් වහන්සේ වෙත එළැඹි  උන්වහන්සේගේ අනුදැනීම මත පැවිද්දට පත් වූ අතර බුදුන් වහන්සේ ඇසුරු කරමින් උන්වහන්සේ වෙනුවෙන් උපස්ථානයෙහි යෙදුන උපවාන භික්ෂූන් වහන්සේ බණ දහම් හදාරමින් දියුණු කර ගත් ප්‍රඥාව ඇත්තේ විවේකස්ථානයක් සොයා ගොස් බවුන් වඩා වැඩිකල් නොගොස් සව් කෙලෙසුන් ප්‍රහීණ කොට ලබන්නා වූ ප්‍රණීත වූ මහ රහත්භාවයට පත් වුණා.

ධාතූන් වහන්සේ නිදන් කළ චෛත්‍යය වටා පුරා මාසයක් ප්‍රදක්ෂිණාවෙහි යෙදෙමින් පදුමුත්තර සර්වඥයන් වහන්සේ නමට ධජ පූජාවක් පැවැත්වීමෙන් උපහාර පැවැත්වූ කුසල් බලයෙන් මහා කල්ප ලක්ෂයක් පුරා දෙව් මිනිස් දෙගතියෙහි උපත ලබා අප්‍රමාණ වූ සැප සම්පත් විඳ අවසානයේ මාගේ ශාසනයෙහි පැවිදව මහ රහත් භාවයට පත් වූහ” යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

බුදුන් වහන්සේගේ දේශනයට සවන් දුන් ශ්‍රාවකයින් බොහෝ දෙනෙක් මාර්ග ඵල ලාභීහු බවට පත් වූ බව සඳහන් ය.

නයනා නිල්මිණී





# ඓතිහාසික කිරිවෙහෙර චෛත්‍යය මළුව ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹේ



විහාරාධිපති කොබවක ධම්මින්ද නාහිමි

කතරගම ඓතිහාසික කිරිවෙහෙර චෛත්‍යය මළුව සැදැහැවතුන්ගේ පහසුව පිණිස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය මත ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ බව කිරිවෙහෙර රාජමහා විහාරාධිපති රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන සංඝනායක කොබවක ධම්මින්ද නාහිමියෝ ප්‍රකාශ කරති.

බුදුන් වහන්සේගේ පා පහස ලද ඓතිහාසික කිරිවෙහෙර සෑ මළුව වසර 2800 කට වඩා පැරැණි ප්‍රෞඪ ඉතිහාසයක් ඇති පූජනීය සිද්ධස්ථානයකි. රජ සමයෙන් පසුව බොහෝ කාලයක් ඝන කැලෑවෙන් වැසී තිබී මීට වසර 60කට පමණ පෙර නැවත කිරිවෙහෙර චෛත්‍යය හා එහි මළුව ප්‍රතිසංස්කරණ කටයුතු කර ඇති බව විහාර ඉතිහාසයේ සඳහන් වන්නේ යැයි ධම්මින්ද නාහිමියෝ කියති.

දහස් සංඛ්‍යාත බැතිමතුන් සෑම පොහෝ දිනකම ඓතිහාසික කිරිවෙහෙර චෛත්‍යය මළුවේ පෙහෙවස් සමාදන් වේ. චෛත්‍යය මළුවේ ප්‍රධාන වාහල්කඩ ඇති ප්‍රදේශයේ විවිධ හැඩැති පැතලි ගල් අතුරා ඇතත් බටහිර දෙසින් චෛත්‍යය මළුව සිමෙන්ති බදාම යොදා සකස් කර තිබී ඇති අතර ඒවා දිරාපත් වී කුහර සෑදී, පොළොවේ මතුපිට වළවල් සෑදී වර්ෂා දිනවලට වතුර පිරෙන තත්ත්වයක් පවතී. එයින් සැදැහැවතුන්ට කරදර බව විහාරාධිපති නාහිමියන් පෙන්වා දීමෙන් පසු මෙම සංවර්ධන කටයුතු ආරම්භ කර තිබෙන බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කියයි.

කිරිවෙහෙර චෛත්‍යය මළුවේ පැරැණි බව ආරක්ෂා වන අයුරින් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් මත මෙම සංවර්ධන කටයුතු සිදු කරන බව ද කොබවක ධම්මින්ද හිමියෝ වැඩි දුරටත් ප්‍රකාශ කරති. මේ වන විට විහාරස්ථානයේ ඉතිහාසය සහිත පුවරුව කිරිගරුඬ බුද්ධ ප්‍රතිමාව ඝන්ඨාර කුලුන ඇතුළු විහාරාංග ස්ථාපිත කර ඇති මලුව ප්‍රතිසංස්කරණය කරන බවත් මළුවෙන් ඉවත් කරන ලද සියලුම ගල් කැබලි කොටස් ඉවත් නොකරන බවත් ඒවා ආරක්ෂිතව විහාරභූමියේ තැන්පත් කරන බවත් නාහිමියෝ ප්‍රකාශ කරති. නමුත් ඇතැම් පිරිස් එම කටයුතුවලට බාධා වන පරිදි අසත්‍ය, පහත් ප්‍රචාර කිරීම ද සිදුකරන බවත් ඒවා සියල්ලම විඳ දරාගෙන සැදැහැවතුන්ගේ පහසුව සඳහා තමන් කිරි වෙහෙර චෛත්‍යය හා මළුව ඉදිරි අනාගත පරපුරට සංරක්ෂිත පූජනීය සිද්ධස්ථානයක් බවට පත් කිරීමේ කටයුතු තමන් සිදු කරන බවත් උන් වහන්සේ ප්‍රකාශ කරති.

මේ සම්බන්ධයෙන් පුරා විද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල් අනුර මනතුංග මහතාගෙන් කල විමසීමක දී මෙසේ කීය.

කතරගම පූජනීය සිද්ධස්ථානයේ ඓතිහාසික වටිනාකම ආරක්ෂා වන පරිදි පරණ බදාම ස්ථරය ඉවත් කොට බදාම අතුරා ඇති චෛත්‍යය මළුවේ කොටස් ඔප දැමීම සිදු කරනවා. පැතලි කලුගල් ඇල්ලීම මේ වන විට සිදුකරනවා. මේ සම්බන්ධයෙන් විවිධ අය කරන අසත්‍යය ප්‍රචාර සියල්ලම ප්‍රතික්ෂේප කරන බවත් පුරා විද්‍යා අධික්ෂණ කටයුතු අනුව චෛත්‍ය මළුවේ සංවර්ධන කටයුතු සිදු කරන බවත් ඒ මහතා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

*ජයකාන්ත ලියනගේ - බලපිටිය විශේෂ*


# අම්බලන්ගොඩ ශාන්ති බෝධි විහාරස්ථානයේ කඨින පුණ්‍ය මහෝත්සවය





**අම්බලන්ගොඩ ශාන්ති බෝධි විහාරස්ථානයේ කඨින පූජා පුණ්‍ය මහෝත්සවය සැදැහැවත් පිරිසකගේ සහභාගිත්වයෙන් පසුගියදා අති උත්කර්ෂවත් ලෙස පැවැත්වුණි. කොළඹ රාජකීය විද්‍යාලයේ ආචාර්ය ශාස්ත්‍රපති අම්බලන්ගොඩ ධම්මාලංකාර හිමියන්ගේ අනුශාසකත්වයෙන් මෙවර ශාන්ති බෝධි විහාරයේ කඨින පූජා පුණ්‍ය මහෝත්සවය සංවිධානය කෙරිණි.**

# දහම විවරණය කෙරෙන ධර්ම චක්‍රය



ධර්ම චක්‍රය යනු සමස්ත බුදු දහමේ සංකේතය යි. බෞද්ධයාගේ උතුම් සංකේතය ද ධර්ම චක්‍රය යි. එය නිවැරැදිව භාවිත කිරීම ධර්මයට කරන ගෞරවයක් ද වෙනවා.

මෙකල බොහෝ ස්ථානවල ඇති ධර්ම චක්‍රය නිවැරැදි ධර්ම චක්‍රය නොවෙයි. චක්‍රයක් නම් රෝදයක් විය යුතුයි. එහි කොටස් එළියට විහිදෙන ආකාරයට තිබීම නිවැරැදි නොවේ.

නිවැරැදි ධර්ම චක්‍රය ලෙස දකින්නට තිබෙන්නේ ඉන්දියාවේ පිහිටා තිබෙන අශෝකස්ථම්භයන් හි ඇති සිංහ ලාංඡනය සමඟ තිබෙන ධර්ම චක්‍රය යි. එහි ගරාදි විසි හතරකි. චතුරාර්ය සත්‍යයේ කාරණා විසි හතර සංකේතවත් කරයි. ජාති,ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, අප්පියෙහි සම්පයෝග දුක්ඛ, පියේහි විප්පයෝග දුක්ඛ, සම්පච්ඡය න ලභති තම්පි දුක්ඛං, සඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා යන දුක්ඛ සත්‍යයට අයත් දුක් දොළසත්, සමුදය සත්‍යයට අයත් කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යන තණ්හා තුනක්, නිරෝධ සත්‍යයට අයත් නිවනත්, මාර්ග සත්‍යයට අයත් ආර්ය අෂ්ඨාංගික මාර්ගවන සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මාර්ගාංග අටත් යන කරුණු විසි හතර ධර්ම චක්‍රයේ ගරාදි විසි හතරෙන් සංකේතවත් වේ.

**නයනා**

## දුටුගැමුණු මහ රජතුමා

89 කොටස

# තිත්ථම්භ සෙනෙවි විහාරමහා දේවියගේ උපායට හසුවේ

ඉතිරි කොටස උඳුවප් පුර අටවක පෝද (30) අන්තර්ජාල කලාපයේ පළවේ

අයන්ති විතාන

**මව් බිසොවුන් වහන්සේ කෙබඳු උපායක් යොදත්දැයි ගැමුණු රජතුමාට සිතාගත නොහැකි විය. දව ආචාර්යතුමාගේ මුහුණේ වූයේත් ප්‍රශ්නාර්ථයකි.**

"නන්දිමිත්‍ර අපේ විසිරී සිටින සියලු සේනාංක සත්බෑ කෝට්ටේ අසල රඳවන්න දාව ආචාර්යතුමනි, සියලුම තොටමුණු බඳ බලකොටු එක දවසින් වැටලීමට සැලසුම් කරන්න. සත්බෑ කෝට්ටේ හැර ඉතිරි කඳවුරුවලට සේනාංක තෝරා නම් කරන්න. එක් එක් මහ සෙනෙවියාට එක් එක් කඳවුර පවරන්න."

"යම් ලෙසකින් අඹතොට බලකොටුව බිඳ වැටුණොත් දකුණු තීරයේ කඳවුරු සියල්ල ඉවත්කර ඇතුළතින් ආරක්ෂක කඳවුරු යෙදීමට එළාර රජු තීරණය කර ඇති බව සිරිනාග අපට දන්වා එවා තිබුණා මතකද?

මහරජතුමනි, අද දහවල් මහ සෙනෙවි මඩුල්ල රැස්වීමට නියමිතයි. එහිදී අඹතොට බලකොටුව ජයගත යුතු ආකාරය සාකච්ඡා කරනවා. දාව ආචාර්යතුමාගේ සැලැස්ම එහිදී ඉදිරිපත් කරන්න පුළුවන්.

ඔව්, ඒක හොඳයි. එහෙමනම් අපි දැන් සත්බෑ කෝට්ටේට යමු. එහි අපේ සේනාංකවලට කඳවුරු සාදා ගැනීමට ඉඩකඩ සලසා දෙමු.

මෑණියනි, දාඨාසේන සමඟ ප්‍රධාන කඳවුරට යන්න. ඔහුගෙන් ඉටුවිය යුතු සේවය ගැන පහදා දෙන්න.

ඔසු පැන් පානයකින් සංග්‍රහ ලැබූ රාජකීය පිරිස විසිර ගියහ. දාඨාසේන අසකු පිට නැගී මවු බිසොවුන් වහන්සේ ගමන් ගත් අස්රියට ආරක්ෂාව සපයමින් මහියංගණයට ආවේ ය. ප්‍රධාන කඳවුරට පැමිණි මව් බිසොව සම් කඩක ඔතා අස් ඔබා සුරක්ෂිතව තල්පතක් දාඨාසේනට දුන්නේ ය. "මෙය තොප පමණක් දැනගත යුතු රහසක්" බව කීවා ය.

"මම තොප ගැන අසා ඇත්තෙමි. තොපගේ සංග්‍රාම ශූරත්වය අගය කරමි. තොප හමුවී කතාබහ කොට හඳුනා ගැනීමේ අදහසින් මම හෙට කඳවුරට එමි."

"දාඨාසේන, අද මෙම තල්පත හීයක බැඳ තිත්ථම්භය සෙනෙවියාගේ බලකොටුව තුළට විදින්න. මේ සමඟ ඇති කාන්තා ඇඳුම් පැළඳුම් පළඳනා ගෙනයන්න. අවශ්‍ය වූ විටකදී ප්‍රයෝජනයට ගන්න" කියමින් විහාර මහා දේවිය සිනාසුණා ය.

පසුදා උදෑසන විහාරමහා දේවිය මනාකොට ඇඳ පැළඳ සමන්තී කුමරිය සමඟ අඹතොටට රාජකීය දෝලාවෙන් පැමිණියා ය. දාඨාසේන ප්‍රමුඛ හේවායෝ පෙළගැසී විහාර මහා දේවිය පිළිගනු ලැබූහ. කඳවුරේ තැන තැන ඇවිදිමින් කඳවුරේ සියල්ලන් සමඟ සුහද කතාබහක නියැළෙන තමන් දෙස බලකොටුවේ අටල්ලෙක සිට ගිජු ලෙස බලන සෙනෙවියා තිත්ථබ සෙනෙවියා විය යුතු යැයි විහාරමහා දේවියට හැඟිණි. හවස් වන තුරුම කඳවුරේ ගතකළ ඇය සමන්තා කුමරිය සමඟ ආපසු යාමට දෝලාවට නැඟෙත්ම ඉහළින් ඇදී ආ හීයක් දෝලාව ඉදිරියෙන් බිම පතිත විය. හීය අවුළා ගත් සෙබළකු හී පත ගෙන විහාරමහා දේවිය දෙස බැලුවේ ය.

"එය මට දෙන්න"

"දේවීන් වහන්ස, බලකොටුවෙන් ආ හීපතක්"

ඔව්, එය දාඨාසේනට විය හැකියි. මම කියවා ඔහුට යවන්නම්"

හීපත අතට ගත් ඇය එහි ඉටි රෙදිකඩ ඉවත් කළා ය.

"දේවීන් වහන්ස, ඔබතුමියගේ දර්ශනය මට මහත් සතුටකි. හමුවීමට කැමැත්තෙන් සිටිමි. ඒ සඳහා දැනට ඉඩකඩ ඇති එකම තැන බලකොටුවේ දකුණු පස උණ පඳුර අසලයි. උණ පඳුර අසල මුවා කළ ඔරුවක් වෙයි. හිරු උදා වී. හෝරාවකට පසුව මම එතැනට එමි."

තල්පත කියවා තවමත් ගිජු ලෙස තමන් දෙස බලා සිටින තිත්ථම්භ සෙනෙවියා දෙස නෙත් යැවූ විහාර මහා දේවිය දෝලාවට නැඟුණා ය.

පසුදා උදෑසනම උතුරු දිග අට්ටාලයට වී පෙරදා දුටු දේවියගේ රූපය දකිනතුරු තිත්ථම්භ සෙනෙවියා නොඉවසිල්ලෙන් මහියංගණ මාවත දෙස බලා සිටියේ ය. එක්වරම කැලෑව තුළ සිට භටයන් කිහිප දෙනෙකු විසින් ඔසවාගෙන එන රාජකීය දෝලාව දැක ලහි ලහියේ අට්ටාලයෙන් බැස රහස් දොරටුවෙන් පිට වී ඔරුවට නැඟුණේ ය.

ඔරුවට තරමක් දුරින් දෝලාව තැබූ භටයන් ඉවතට ගියහ. දුහුල් සළුවකින් හිස ආවරණය කරගත් දේවිය දෝලාවෙන් බසිත් ම තිත්ථම්භ සෙනෙවියා ඇය පිළිගැනීමට නැඟී සිටියේ ය.

කෙඳිරිලි හඬක් නඟන්නට ද ඉඩ නොතබා ගෙළට වැදුණු කඩු පහරින් ඔරුවෙහි ම වැටුණු ඔහු එහිම පාවෙන්නට හැර කැලයෙහි සැඟව සිටි දුර්ගම සංග්‍රාමික භටයන් දෝලාව ඔසවාගෙන රහස් දොරටුවෙන් බළකොටුව තුළට ඇතුළු වූහ.

බලකොටුව තුළින් ඇසෙන්නට වූ මරහඬත් සමඟම විවෘත වූ මහ දොරින් ඇතුළු වූ සිංහල මහ සේනාව දවස පුරාම සොළී භටයන් කඩු ගෑහ. එක්රැස් කර තිබූ සියලු ධන ධාන්‍ය එළියට ඇද දමා බලකොටුවට ගිනි තබන ලදී.

දාව ආචාර්යතුමාගේ උපදෙස් පරිදි මහගංතොට තෙක් සියලුම කඳවුරු හා බලකොටු එකවර වටකර පහරදීම ඇරැඹිණි.

දුටුගැමුණු රජතුමා මෙහෙය වූ ඵුස්සදේව ප්‍රමුඛ සේනාංකය සත්බෑ කෝට්ටේ බලකොටුව එක් දවසින් බිඳ හෙලූහ. එහි ගබඩා කර තිබූ රන්, රිදී, මුතු, මැණික් ඇතුළු වස්තු සම්භාරය එකතු කර ගොඩ ගසන ලදී. වෙහෙර, විහාර බිඳ දමා නිධන් වස්තු කොල්ලකා, තොටමුණුවලදී වෙළෙඳුන්ගෙන් පැහැරගන්නා ලද දේපළ සියල්ල මහජනයා අතර බෙදා දීමට නියම විය.

සියලු කඳවුරු ජයගෙන කසාතොට දී එක්විය යුතු යන්න දුටුගැමුණු රජතුමාගේ නිවේදනය විය. ලක්ෂ සංඛ්‍යාත බල සේනාවට සම්මාන හා ත්‍යාග පිරිනැමීම කසාතොට දී සිදුවිය.

විහාර මහා දේවියගේ උපදෙස් අනුව තුන් මසක විවේකයක් සියලුම සෙබළුනට දීමට තීරණය විය. තමන්ගේ මවුපියන්, දරුවන්, බිරින්දෑවරුන් බලා එන්නට ලැබුණු නිවාඩුවෙන් කවුරුත් සතුටට පත්වූහ.

